**මහජන බැංකුවේ හා එහි පරිපාලිත සමාගම් - 2022**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මහජන බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මුදල් පනතේ 5(1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත.

බැංකුවේ හා සමූහයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුව හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

**1.5 . ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.5.1. ලැබිය යුතු මුදල්**

**1.5.1.1. අපේක්ෂිත භාරදීම් (Pending Deliveries) වෙනුවෙන් අවිනිශ්චිත ගිණුම් ගෙවීම් (ජර්නල් කේත - 393470)**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ උපකරණ ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන්ට ලබා දුන් අත්තිකාරම් ඉහත ගිණුමට ඇතුළත් කර ඇති අතර ගෙවීම් අවසන් වූ පසු ලබා ගන්නා ලද සේවාවේ ස්වභාවය අනුව ප්‍රාග්ධනිත කරනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට ඉහත කී ගිණුමේ රු.1,185,766,976 ක ශේෂයක් පෙන්වා ඇති අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | සැපයුම් කරුවන්ට ගෙවනු ලැබූ අත්තිකාරම්වලින්, අපේක්ෂිත භාරදීම් (Pending Deliveries) වෙනුවෙන් අවිනිශ්චිත ගිණුම් ශේෂය (ජර්නල් කේත 393470) සමන්විත වේ. අදාල ව්‍යාපෘතිය අවසන් විමෙන් පසු ඉතිරි ගෙවීම් කිරීමෙන් අනතුරුව පමණක් ශේෂයන් ප්‍රාග්ධනිත කළ හැක. එතෙක් මෙම ගිණුමේ මුදල් රඳවා තබා ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දිගු කාලීනව පැවත එන හිඟ ශේෂයන් නිරවුල් කිරීම සහ ශේෂයන් නිවැරදිව හඳුනා ගැනීම සහතික වීම, වර්ගීකරණය කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |
| (i) රු.813,556,548 ක් වූ ඇතැම් ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව වසරකට වැඩි කාලයක් හිඟව පැවතුණි. | අපේක්ෂිත භාරදීම් (Pending Deliveries) වෙනුවෙන් අවිනිශ්චිත ගිණුම් ගෙවීම් ව්‍යාපෘතිය අවසන් වූ පසු නිරවුල් කෙරේ. | තවද,මෙම අයිතමවලින් බොහොමයක් මෘදුකාංග ප්‍රසම්පාදනයට සම්බන්ධ බැවින්, ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන සැලකිය යුතු කාල ප්‍රමාදයත් සමඟ මේවා ප්‍රයෝජනවත් නොවිය හැක. |
| (ii) ඉහත කී පරිදි, සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් ඉහත ගිණුමේ සටහන් කර ඇත. ඉහත ගිණුමේ හිඟ ශේෂයට දත්ත ගබඩා කිරීමේ ව්‍යාපෘතිය (Datawarehouse Project) සහ අයදුම්පත් නැවත ලිවීමේ වැඩසටහන (Application Rewrite Program) යටතේ තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකුට (Just In Time සහ Innova IT systems) සිදු කරන ලද රු.184,220,563 ක අත්තිකාරම් ගෙවීමක් ඇතුළත් වේ. කෙසේ වෙතත් වත්කම් නොමැතිකම හේතුවෙන් සම්පූර්ණ මුදල සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. | වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.<br><br>අයදුම්පත නැවත ලිවීමේ ව්‍යාපෘතිය (Application Re-Write Project) රු. මිලියන 49.8. - 2023 ඔක්තෝබර් 31 දිනට පරිශීලක දෙපාර්තමේන්තු ඉලක්කය සම්පූර්ණ කිරීමත් සමඟ ගෙවීම් අවසන් කිරීම සිදු කරමින් පවතී. ශේෂය කපා හැරීම සඳහා ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතී.<br><br>DWH ව්‍යාපෘතිය- කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ තීරණය මත ව්‍යාපෘතිය අවසන් කරන ලදී. ඒ අනුව රු. 137,187,229.88 ක ප්‍රතිපාදනයක් සිදු කර ඇත. | |
| (iii) සැපයුම් අංශය විසින් ලබා දී ඇති වාර්තාවන්ට අනුව රු. 84,631,716 ක දිගුකාලීන ශේෂයක් ඉතිරිව ඇති අතර මේ සම්බන්ධයෙන් විගණනයට විස්තර ඉදිරිපත් කර නොතිබුණි.කෙසේ | JIT ටෙක්නොලොජීස් වෙත 2023 අප්‍රේල් 18 සහ 2023 අගෝස්තු 17 යන දිනයන්හිදී ලිඛිත සාක්ෂි ඉල්ලුම් කරමින් ලිපි යවා ඇත. | |

| | |
|---|---|
| වෙතත්, පවතින විගණන සාක්ෂිවලට අනුව, 2018 දී බැංකුව විසින් JIT ටෙක්නොලොජීස් ආයතනය වෙත රු.84,631,716 ක ගෙවීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ලේඛනමය සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් වී නොමැත. තවද, මෙය බැංකුවේ ඩිජිටල් බැංකුකරණ ව්‍යාපෘතිය සඳහා වන ගිවිසුම යටතේ ආවරණය නොවන අතිරේක ගෙවීමක් බව වැඩිදුරටත් විගණනයට අනාවරණය විය. | කෙසේ වෙතත්, JIT වෙතින් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. |

### 1.5.2. අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1.5.2.1. 2022 වර්ෂය තුළ බැංකුව විසින් රු.මිලියන 484,180.94 ක වටිනාකමකින් යුත් ණය 114,310 ක සංඛ්‍යාවක් ප්‍රදානය කර ඇති අතර ඉන් වටිනාකම රු. මිලියන 5,953.74 ක් වූ ණය 2380 ක සංඛ්‍යාවක් 2022 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීය ගණයට මාරු කර ඇත. තවද, අක්‍රීය ගණයට මාරු කරන ලද ඉහත ණය අතරින්, රු. මිලියන 1,997.51ක වටිනාකමකින් යුතු වූ ණය 450 කින් එක් වාරිකයක්වත් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවට නොහැකි වී ඇත. | 2022 වර්ෂයේ දී ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. මිලියන 484,180.94 ක් වූ අතර 2022 වර්ෂය වන විට එම අත්තිකාරම්වල ඉතිරි ප්‍රාග්ධනය රු. මිලියන 466,267 ක් විය. ඒ අනුව, අක්‍රීය ගණයට මාරුවීමේ ප්‍රතිශතය 1.2% ක් වන අතර (එනම් ලබා දී ඇති රු. මිලියන 484,180.94 ක මුළු ණය මුදලින් රු. මිලියන 5,953.74 කි) එය රටේ සාර්ව ආර්ථික තත්ත්වයන් අනුව පිළිගත හැකි තත්ත්වයකි. රු.මිලියන 5,953.74 ක වටිනාකමකින් යුක්තවූ අක්‍රීය ණය 2380 ක සංඛ්‍යාවක් අතුරින්, 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වටිනාකම රු. මිලියන 1,997.51 ක් හා අවිනිශ්චිත පොලී වටිනාකම රු. මිලියන 216.44 ක් වූ ණය ගිණුම් 450 ක එක් වාරිකයක් වත් අයකර ගැනීමට බැංකුවට නොහැකි විය. මීට අමතරව, 2022.12.31 දිනට අවිනිශ්චිත පොලී (Interest In Suspense) වටිනාකම දළ වශයෙන් රු. මිලියන 66,667.60 ක් වූ අතර එයින් 65% ක් ඉහළම අක්‍රීය ණය 25 සඳහා වූ සමුච්චිත පොලිය රු. මිලියන 43,447.37 ක් විය. | අනුමත මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට සහ ඵලදායීව හා කාර්යක්ෂමව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. තවද, අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකුවේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. |
| 1.5.2.2. 2022 වර්ෂයේදී බැංකුව විසින් රු. මිලියන 276.67 ක ප්‍රාග්ධනය සහ රු. මිලියන 365.45 ක පොලියෙන් සමන්විත වන මුළු වටිනාකම වූ රු. මිලියන 642.12 ක් වූ ණය එකතුවක් කපා හැර ඇත. කපා හරින ලද ණය ශේෂවලින් රු. මිලියන 15.35 ක් 2022 වර්ෂය තුළ අයකරගෙන තිබුණි. පසුගිය වසර පහ තුළ කපා හරින ලද ශේෂයන් සහ කපා හරින ලද අයකරගැනීම් | ගිණුම් පොත් නිසි ලෙස පිළිබිඹු කිරීමේ අරමුණින් බැංකුව විසින් සෑම වසරකදීම ආපසු අයකරගත නොහැකි අක්‍රීය ණය සඳහා කපා හැරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. එවැනි කපා හරින ලද අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා ගත හැකි සියලු අයකිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩව ගෙන ඇත. | |

(Written off Recoveries) පිළිබඳ විස්තර පහත දැක්වේ.

රු. (මිලියන)

| වර්ෂය | මූලික ණය මුදල | පොළිය | මුළු එකතුව | කපා හරින ලද අයකිරීම් |
|---|---|---|---|---|
| 2018 | 254.86 | 641.05 | 895.91 | 25.96 |
| 2019 | 329.29 | 74.00 | 403.29 | 71.53 |
| 2020 | 363.20 | 1,321.12 | 1,684.32 | 13.57 |
| 2021 | 108.86 | 761.26 | 870.12 | 15.29 |
| 2022 | 276.67 | 365.45 | 642.12 | 15.35 |

1.5.2.3. 2022 දෙසැම්බර් 31 වන විට, අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය රු. මිලියන 332,794 වූ අතර එය පෙර වසර හා සසඳන විට රු. මිලියන 179,443 කින් වැඩිවීමකි. තවද, පසුගිය වර්ෂයයේ රු. මිලියන 207,799 ක් වූ අදියර 2 යටතේ වර්ගීකරණය කරන ලද ණය රු.මිලියන 276,877 දක්වා වැඩි වී ඇත.

1.5.2.4. 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ රු.මිලියන 5 ට වඩා වැඩි අක්‍රීය අයිරා ශේෂය රු. මිලියන 7,552.87ක් වූ අතර එය ප්‍රාග්ධන වටිනාකම රු.මිලියන 2,168.83 කින් හා පොලී වටිනාකම රු.මිලියන 5,384.04 කින් සමන්විත වේ.

1.5.2.5. 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ඉහළම අක්‍රීය ණය (NPL) 10 හි මුළු ශේෂය රු.මිලියන 71,439.41 ක් වන අතර එයට ප්‍රාග්ධනය රු.මිලියන 40,520.61ක් හා පොලිය රු.මිලියන 30,918.80 ක් අන්තර්ගත වේ. විස්තර පහත දක්වා ඇත.

තවද, අයකිරීම් ක්‍රියාවලියේ සඵලතාවය සහතික කිරීම සඳහා, අයකිරීම් දෙපාර්තමේන්තුවේ (Recovery Department) ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් ලෙස කපා හරින ණය ආපසු අයකර ගැනීම සකසා ඇති අතර එය මාසිකව සමීපව අධීක්ෂණය කරනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට කපා හරින ලද ප්‍රාග්ධන වටිනාකම රු. මිලියන 276.67 කි. තවද, මේ වන විට අයකරගත් මුදල රු. මිලියන 15.35 ක් සහ කපා හරින ලද මුදලට සාපේක්ෂව අයකරගත් මුදලේ ප්‍රතිශතය සියයට 5.5 කි. මීට අමතරව, බැංකුව විසින් පොළී කපා හැරීමක් සිදු නොකල අතර, 2022 වර්ෂයේදී කපා හරින ලද ප්‍රාග්ධන වටිනාකම රු. මිලියන 229.89 ක් එක් ණයකරුවකුගේ පහසුකම් තුනකින් සමන්විත ණය මුදලින් අන්තර්ගත විය.

2022 වර්ෂයේ දෙවන කාර්තුව තුළ විෂය මූලික සාක්ෂි (Objective Evidence) පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් (රු. බිලියන 57.5), ලංකා පොහොර සමාගම (රු. බිලියන 24.1), සහ කලම්බු කොමර්ෂල් පොහොර (රු. බිලියන 15.1) කේවල හානිකරණයේදී (Individual Impairment) 3 වන අදියර යටතේ තක්සේරු කරන ලදී. අදියර 2 වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2022 දෙසැම්බර් 31 වන දිනට ස්වෛරීත්වය පහත හෙලීම මත DST 1 අදියරේ සිට 2 අදියර දක්වා මාරුවීමයි.

2023 අගෝස්තු 31 දිනට රු. මිලියන 5ට වැඩි අක්‍රීය අයිරා (OD) ශේෂය ගිණුම් 18 ක ප්‍රාග්ධනය රු. මිලියන 684.60 කින් කින් වැඩි වී ඇත. මෙම අහිතකර බලපෑම අප දැනටමත් හඳුනාගෙන ඇති අතර දෛනිකව සමීපව අධීක්ෂණය කර සෑම මාසයකම සමාලෝචනය කරනු ලැබේ.

ණය ආපසු අයකර ගැනීම සඳහා ගෙන ඇති සියලු ක්‍රියාමාර්ග හේතුවෙන් අක්‍රීය (NP) ණයවල ප්‍රාග්ධන තත්ත්වය අඩු වී ඇත.

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ශේෂය රු. මිලියන 40,520.61ක් වන අතර 2023 අගෝස්තු 31 දිනට ප්‍රාග්ධන ශේෂය

රු.මිලියන 37,413.03කි. ඒ අනුව සියයට 8 ක අඩුවීමක් ළඟාකර ගෙන ඇත (රු. මිලියන 3,107.58).

| | ගනුදෙණුකරුගේ නම | ප්‍රාග්ධන ශේෂය රු. මිලියන | පොලී ශේෂය රු. මිලියන | මුළු ශේෂය රු.මිලියන |
|---|---|---|---|---|
| 1 | ලාෆ් ගෑස් සමාගම. | 835.76 | 142.84 | 978.59 |
| | ලාෆ් ඉංජිනේරින් (පුද්) සමාගම. | 123.31 | 15.55 | 138.86 |
| | ලාෆ් ටර්මිනල් සමාගම. | 8,461.04 | 1,154.56 | 9,615.60 |
| | | **9,420.11** | **1,312.94** | **10,733.05** |
| 2 | ශ්‍රී ඉක්විප්මන්ට් මූල්‍ය සමාගම. | **5,493.75** | **499.81** | **5,993.56** |
| 3 | W.M. මෙන්ඩිස් සහ සමාගම. | **3,869.20** | **507.67** | **4,376.87** |
| 4 | ද ග්‍රෑන්ඩ් මවුන්ටන් හෝටල් (පුද්) සමාගම. | 1,467.23 | 272.12 | 1,739.35 |
| | ලක් ස්ටීල් ඉංජිනේරින් (පුද්) සමාගම. | 1,813.88 | 283.32 | 2,097.20 |
| | ලක් ජිප්සම් (පුද්) සමාගම. | 168.79 | 23.49 | 192.28 |
| | ලක් බ්‍රෑන්ඩ් ෆර්නිචර්. | 59.12 | 8.40 | 67.52 |
| | | **3,509.02** | **587.33** | **4,096.35** |
| 5 | හුරාවී ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | **3,479.38** | **1,497.87** | **4,977.24** |
| 6 | මිහින් ලංකා (පුද්) සමාගම | **3,391.48** | **439.07** | **3,830.54** |
| 7 | CML MDT කන්ස්ට්‍රක්ෂන් සමාගම | 2,672.64 | 1,865.75 | 4,538.39 |
| | වෝකර්ස් පයිලින්ග් (පුද්) සමාගම. | 343.45 | 259.83 | 603.28 |
| | වෝකර්ස් ඉක්විප්මන්ට් (පුද්) සමාගම. | 293.16 | 208.78 | 501.94 |
| | වෝකර්ස් සන්ස් ඇන්ඩ් කෝ- ඉංජිනියර්ස් (පුද්) සමාගම. | 25.55 | 49.51 | 75.06 |
| | MTD වෝකර්ස් සමාගම | 2.13 | 2.47 | 4.60 |
| | | **3,336.93** | **2,386.35** | **5,723.27** |
| 8 | යශෝධා හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම. | 2,424.32 | 18,021.82 | 20,446.14 |
| | යශෝධා මාර්කටින් සර්විසස් (පුද්) සමාගම. | 0.73 | 5.32 | 6.06 |
| | යශෝධා ඇඩ්වර්ටයිසින් (පුද්) සමාගම. | 0.47 | 3.44 | 3.91 |
| | යූනි ඒජන්සීස් ට්‍රාන්ස්පෝර්ට් (පුද්) සමාගම. | 0.84 | 6.18 | 7.02 |
| | රුහුණු ඇග්රෝ ෆර්ටිලයිසර් සමාගම. | 498.50 | 3,769.72 | 4,268.22 |
| | රුහුණු ප්ලයිවුඩ් | 90.25 | 586.73 | 676.98 |
| | යූනි ප්‍රින්ටර්ස් (පුද්) සමාගම. | 11.02 | 91.77 | 102.79 |
| | මර්නි බේකරි ඉක්විප්මන්ට්. | 4.30 | 27.04 | 31.34 |
| | | **3,030.44** | **22,512.02** | **25,542.46** |
| 9 | නවලෝක ස්ටීල් ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම. | 524.75 | 162.62 | 687.38 |
| | නවලෝක කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම. | 2,226.12 | 539.91 | 2,766.04 |
| | ඊස්ට් වෙස්ට් මාර්කටින් (පුද්) සමාගම. | 138.50 | 22.96 | 161.46 |
| | නිව් ඇෂ්ෆෝර්ඩ් ඉන්ටර්නැෂනල්. | 33.18 | 6.92 | 40.11 |
| | | **2,922.56** | **732.42** | **3,654.98** |
| 10 | සමුපකාර තොග වෙළඳ සංස්ථාව. | **2,067.74** | **443.35** | **2,511.09** |
| | | **40,520.60** | **30,918.80** | **71,439.41** |

1.5.2.6. රාජ්‍ය සතු ව්‍යවසායන්ට (SOEs) මුළු නිරාවරණය

අදහස් සටහන් කරගන්නා ලදී.

(i) රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) අයත් ණය සහ අත්තිකාරම්වල සම්පූර්ණ ලැබිය යුතු ශේෂය රු.මිලියන 871,619 ක් ලෙස වාර්තා වූ අතර එය 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවෙහි මුළු ණය හා අත්තිකාරම්වලින් සියයට 45.5 කි. කෙසේ නමුත්, රාජ්‍ය ව්‍යවසායන්ට (SOEs) අයත් ණය ශේෂය පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 65,767 හෙවත් සියයට 7කින් පහළ ගොස් ඇත.

අදහස් සටහන් කරගන්නා ලදී.

(ii) 2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන හා රජයෙන් අනෙකුත් ලැබීම් රු.මිලියන 1,024,096 ක් වූ අතර ඒ අනුව රාජ්‍ය ව්‍යවසායන්ට මුළු නිරාවරණය රු.මිලියන 1,895,715ක් හෙවත් බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 63.79 ක් විය.

අදහස් සටහන් කරගන්නා ලදී.

(iii) පසුගිය වසර පහක කාලය තුල රජය සතු ව්‍යවසායන්ගෙන් ලැබිය යුතු මුළු ණය සහ අත්තිකාරම් ශේෂය සහ ආයෝජන සහ රජයෙන් අනෙකුත් ලැබීම් පහත පරිදි වේ.

| **ණය සහ අත්තිකාරම්** | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
|---|---|---|---|---|---|
| රාජ්‍ය ව්‍යවසාය සඳහා ලබාදුන් ණය සහ අත්තිකාරම් (රු. මිලියන) | 551,110 | 601,297 | 844,821 | 937,386 | 871,619 |
| පසුගිය වර්ෂයට සාපේක්ෂව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය ශේෂයෙහි වැඩිවීම. (රු.මිලියන) | 197,821 | 50,197 | 243,525 | 92,564 | (65,767) |
| **පසුගිය වර්ෂයට සාපේක්ෂව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය ශේෂයෙහි වැඩිවීම. (%)** | **56.00** | **9.11** | **40.55** | **10.96** | **(7.02)** |
| මුළු ණය සහ අත්තිකාරම් (රු.මිලියන) | 1,334,420 | 1,386,481 | 1,723,466 | 1,936,974 | 1,915,788 |
| **බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම්වලින් රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබාදුන් ණය ශේෂය (%)** | **41.30** | **43.37** | **49.02** | **48.39** | **45.50** |
| බැංකුවේ මුළු වත්කම් (රු.මිලියන) | 1,734,703 | 1,873,406 | 2,230,119 | 2,647,641 | 2,972,028 |
| බැංකුවේ මුළු වත්කම්වලින් රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබාදුන් ණය ශේෂය (%) | 31.77 | 32.10 | 37.88 | 35.40 | 29.33 |

| | | | | | |
|---|---|---|---|---|---|
| රජයෙන් ලැබිය යුත් ආයෝජන සහ අනෙකුත් ලැබිය යුතු දෑ (රු.මිලියන) | 328,158 | 419,217 | 435,343 | 672,155 | 1,024,096 |
| **රාජ්‍ය ව්‍යවසාය සඳහා ලබාදුන් ණය ශේෂයෙහි මුළු වත්කම් නිරාවරණය (Total Asset exposure of SOEs) (රු.මිලියන)** | **879,257** | **1,020,514** | **1,280,164** | **1,609,540** | **1,895,715** |
| රාජ්‍ය ව්‍යවසාය සඳහා ලබාදුන් ණය ශේෂයෙහි මුළු වත්කම් නිරාවරණය (Total Asset exposure of SOEs) (%) | 50.69 | 54.47 | 57.40 | 60.79 | 63.79 |
| **රාජ්‍ය ව්‍යවසායන් සඳහා ගෙවිය යුතු ශේෂය (ණය සහ තැන්පතු)Total Payable to SOEs (Borrowings &Deposits) (රු.මිලියන)** | **271,085** | **217,791** | **222,257** | **226,722** | **418,932** |

(iv) මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජොෂ්ඨ පුරවැසි තැන්පතු, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා සඳහා ලැබිය යුතු පොලී සහ රජයේ භාණ්ඩාගාරයෙන් ලැබෙන සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා හි එකතු කළ ලැබිය යුතු ශේෂයන් සඳහා මුදල් ගෙවීම වෙනුවට රු.මිලියන 323,401.67 ක භාණ්ඩාගාර බැඳුම්කර 2022 වර්ෂය තුල නිකුත් කර ඇත. තොරතුරු පහත පරිදි වේ.

| | **රු.මිලියන** |
|---|---|
| භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | 309,999.96 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 3,364.76 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 6,672.19 |
| ජොෂ්ඨ පුරවැසි තැන්පතු | 2,195.98 |
| එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා | 233.41 |
| භාණ්ඩාගාරයෙන් ලැබෙන සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා | 935.37 |
| **එකතුව** | **323,401.67** |

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු අයිරා ශේෂය අඩු කිරීම සඳහා බැංකුව වෙත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. බැංකුව ආරම්භයේදී මුදල් පදනම මත ණය ආපසු ගෙවීමට අවධාරනය කරන ලදී. කෙසේ වුවත්, ඒ වෙනුවට රජයේ සුරකුම්පත් භාර ගන්නා ලෙස අපහට උපදෙස් ලැබිණි. ඉහත කී පියවීම් වෙනුවට මෙම භාණ්ඩාගාර බැඳුම්කර භාර ගන්නා ලෙස බැංකුවට උපදෙස් දී ඇති බැවින් මේවා බැංකුවේ ආයෝජන තීරණ නොවේ.

දිගුකාලීන බැඳුම්කර සඳහා තරමක් ආකර්ශනීය පොලී අනුපාත තිබියදීත්, බැංකුව එම අවස්ථාවේ මුහුණ දුන් දැඩි ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් කෙටි කාලීන සුරකුම්පත් (භාණ්ඩාගාර බිල්පත්) තෝරා ගන්නා ලදී. මෙම විකල්පය නොතිබූ බැවින්, බැංකුව කෙටිම කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර ඉල්ලා සිටින ලදී. මේවායින් බොහොමයක් පසුගිය භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේ WAYR ට නිකුත් කර ඇති අතර මෙහි ඵලදා අනුපාතය වෙළඳපල අනුපාතවලට වඩා අඩු විය. එබැවින්, බැංකුවට සිදුවිය හැකි MTM පාඩු වළක්වා ගැනීම සඳහා, වත්කම්- වගකීම් කමිටුව (ALCO) හි අනුමැතිය සහිතව ක්‍රමක්ෂය පිරිවැය (Amortized Cost) (HTM) යටතේ වාර්තාකර ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය-2022 දී

1.5.2.7. ඉහළම රාජ්‍ය ව්‍යවසාය ණය සහ අත්තිකාරම් 10

2022 දෙසැම්බර් 31 දිනට ඉහළම රාජ්‍ය ව්‍යවසායන්(SOE) ණය 10 හි අගය රු. මිලියන 811,307 ක් වූ අතර එහි රු. මිලියන 715,005 ක් වූ ප්‍රාග්ධනය සහ රු. මිලියන 27,308 ක් වන පොලියෙන් සමන්විත විය. එය රාජ්‍ය ව්‍යවසායන්හි (SOEs) මුළු ලැබිය යුතු ණය සහ අත්තිකාරම් වලින් සියයට 82 ක් ලෙස පෙන්නුම් කරයි. 2022 දෙසැම්බර් 31 වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) ඇමරිකානු ඩොලර් මිලියන 1,093 ක ණය ශේෂයක් රජයේ භාණ්ඩාගාරයට පවරාගෙන ඇත. කෙසේ වෙතත්, ඉහත පවරා ගත් ණය බැංකුවේ පොත්වල සකස් කර නොතිබූ අතර පද්ධතිය තුළ පොලියද උපචිත වේ. එබැවින්,මහා භාණ්ඩාගාරය සහ CPC සමඟ වැඩපිළිවෙල අවසන් කිරීමට බැංකුවට අවශ්‍ය වේ. 2022 දෙසැම්බර් 31 දිනට ඉහළම රාජ්‍ය ව්‍යවසාය (SOE) ණය දහයේ විස්තර පහත දක්වා ඇත.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මඟින් පොළිය ගෙවන ලද අතර 2023 ජූනි මාසයේදී මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබීමෙන් පසු සියලු ගෙවිය යුතු මුදල් පියවනු ලැබීය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - නියමිත වාරිකවලින් කොටසක් අයකර ගැනීම සඳහා 2022 අගෝස්තු සහ 2023 පෙබරවාරි මාසවල භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. 2023.06.30 දක්වා නියමිත වාරික සියල්ල අයකර ගැනීමට ගනුදෙණුකරු විසින් 2023 සැප්තැම්බර් 26 දින මුදල් ප්‍රේෂණය කරන ලදී.

ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් -2021 Q2 සඳහා සම්පූර්ණ ජ්‍යෙෂ්ඨ පුරවැසි පොලී සහනාධාර හිමිකම් පෑම රු. 3,233,999,309.81

අදහස් සටහන් කර ගන්නා ලදී.

රජයේ භාණ්ඩාගාරය විසින් පවරා ගන්නා ලද ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ණයෙහි වත්මන් තත්ත්වය පහත පරිදි වේ; රජයේ පොත් වෙත වගකීම පැවරීමේ සියලුම සාකච්ඡා සඳහා මහා භාණ්ඩාගාරය මෙතෙක් මැදිහත් වී ඇතත්, දැන් එම ක්‍රියාවලිය IMF ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ක්‍රියාවලියේ නියමයන් සහ කොන්දේසි අවසන් කිරීම සඳහා බැංකු දෙකම ඔවුන් සමඟ සාකච්ඡා තවමත් සිදුවෙමින් පවතී.

2023 සැප්තැම්බර් 04 දිනැති අපගේ ලිපිය පරිදි මුදල් අමාත්‍යාංශයේ ඇති අරමුදල් මඟින් දැනට පවතින වගකීම්වල පොලිය පියවන ලෙසට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙතින් ඉල්ලීමක් සිදු කර ඇත.

| ආයතනය | **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (රු.මිලියන)** | සුරැකුම් | සුරැකුම් අගය |
|---|---|---|---|
| භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | 60,323 | සුරැකුම් රහිත | - |
| ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 414,553 | භාණ්ඩාගාර හානි රක්ෂණය | ඇ.ඩො.මිලි. 1650 |
| | | භාණ්ඩාගාර ඇපකරය | ඇ.ඩො.මිලි. 7.73 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 107,642 | භාණ්ඩාගාර ඇපකරය | රු.මිලි. 6,500 |
| | | ලැබියයුතු දෑ වලට එරෙහිව උකස්කරය | රු. මිලි.38,800 |
| | | සුරැකුම් රහිත (රු. මිලි 22,411) | - |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 71,697 | භාණ්ඩාගාර ඇපකරය | රු.මිලි.35,000<br>ඇ.ඩො. මිලි.44.72 |
| | | භාණ්ඩාගාර හානි රක්ෂණය | රු.මිලි. 8,380.09 |
| | | භාණ්ඩාගාර භාරගැනීමේ ලිපිය | රු.මිලි. 12,892.88 |
| | | මුදල් තැන්පතු පැවරීම | රු.මිලි.3,688 |
| ශ්‍රී ලංකන් එයාලයින්ස් | 57,536 | භාණ්ඩාගාර ඇපකරය | රු.මිලි. 8,289.39<br>ඇ.ඩො.මිලි. 5.38 |
| | | භාණ්ඩාගාර සහන ලිපිය | රු.මිලි.13,350<br>ඇ.ඩො.මිලි. 100 |
| ලංකා පොහොර සමාගම | 25,666 | භාණ්ඩාගාර සහන ලිපිය | රු.මිලි. 28,827.98 |
| | | ස්ථාවර තැන්පතු | රු.මිලි. 1,270.42 |
| විශ්‍රාම අධ්‍යක්ෂ | 21,651 | භාණ්ඩාගාර ඇපකරය | අවබෝධතා ගිවිසුම සහ ප්‍රාථමික ලේඛන |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 16,054 | භාණ්ඩාගාර සහන ලිපිය | රු.මිලි. 18,637.65 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 15,793 | භාණ්ඩාගාර ඇපකරය | රු.මිලි. 3,961.03<br>යූරෝ මිලි. 7,624.77 |
| | | භාණ්ඩාගාර භාරගැනීමේ ලිපිය | රු.මිලි. 11,680.86 |
| සිලෝන් ෂිපින් කෝපරේෂන් | 20,392 | භාණ්ඩාගාර ඇපකරය | ඇ.ඩො.මිලි. 71.91 |
| **එකතුව** | **811,307** | | |

1.5.2.8. බිම්පුත් මූල්‍ය සමාගම

බිම්පුත් ෆිනෑන්ස් 2007 වසරේ ස්ථාපිත කරන ලද දයා සමූහ ව්‍යාපාරයට අයත් ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක් වන අතර 2012 වසරේ සිට ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන්හි නිරත වේ. 2017-2019 කාලය තුළ ඉහත කී සමාගමට රු. මිලියන 700 ක කාලීන ණය තුනක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2017 මාර්තු 10, 2018 දෙසැම්බර් 17 සහ 2019 අප්‍රේල් 25 දිනැති ණය අර්පණ ලිපිවල විශේෂ කොන්දේසි අංක (1) අනුව, සෑම කාර්තුවකම එළඹෙන පළමු සතියේ බැංකුව වෙත ආයතනයේ ලැබිය යුතු ණය ලැයිස්තුව ලබා දීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ණය අර්පණ ලිපිවල විශේෂ කොන්දේසිය අනුව එවැනි යාවත්කාලීන ණය ලැයිස්තුවක් ලබා ගැනීමට බැංකුව කටයුතු කර නොතිබුණි.

සමාගම ණය හිඟ වීමට ප්‍රධාන හේතුව වූයේ කොවිඩ්-19 බලපෑමයි. 2020 මාර්තු වන තෙක්, සමාගම කිසිදු ප්‍රමාදයකින් තොරව ඔවුන්ගේ සියලුම වාරික සේවා කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ්-19 බලපෑමෙන් පසුව, බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති පරිදි ගනුදෙනුකරු වෙත පමාසහන (Moratorium) පහසුකම ලබා දීමට සිදු වූ අතර එය අයකිරීම් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී.

ත්‍රෛමාසික සිහිකැඳවීම් ගනුදෙනුකරු වෙත විද්‍යුත් තැපැල හරහා යවා 2021 මාර්තු 31 දිනට ලැබිය යුතු ණය ලැයිස්තුවක් ලබා ගන්නා ලදී. හිඟ ණය සහ පියවූ ණය ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු ණය පහසුකම් අක්‍රිය ගණයට මාරු කරන තෙක් යාවත්කාලීන කරන ලද ණය ලැයිස්තුව බැංකුවට ලැබෙන්නේ මෙම අවස්ථාවේදී ය.

කෙසේ වෙතත් අයකර ගැනීමේ ක්‍රියාවලියේදී දයා සමූහයේ ආයතනික ඇපකරය ලබා ගැනීමට බැංකුවට හැකි විය.

(ii) ඉහත සඳහන් ණය අර්පණ ලිපිවල විශේෂ කොන්දේසි අංක (2) සහ (3) ට අනුව, ගණුදෙනුකරු විසින් මාස තුනකට වැඩි කාලයක් හිඟව පවතින ඕනෑම ණය ගිවිසුමක් ක්‍රියාකාරී ලැබිය යුතු ණය ගිවිසුමක් සමඟ ප්‍රතිස්ථාපනය කළ යුතු අතර පියවූ ගිවිසුම්ද ප්‍රතිස්ථාපනය කළ යුතු ය. කෙසේ වෙතත්, එවැනි පසු විපරමක් බැංකුව විසින් සිදු කර නොතිබුණි.

පොත් ණයවලට අමතරව, බැංකුව විසින් දයා සමූහ ව්‍යාපාරයේ ආයතනික ඇපකරයක් ඇපකර ලෙස ලබාගෙන ඇති අතර මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) අනුමැතිය ලබාගෙන ඇත.

(iii) බැංකුවේ ණය මෙහෙයුම් අත්පොතේ 5 වන පරිච්ඡේදයේ 6.2.8 වගන්තියට අනුව, ණයගැති පොත් (Book Debt) සුරකුම්වලට එරෙහිව ලබා දී ඇති ණය සඳහා උපරිම ආපසු ගෙවීමේ කාලය වසරකි. කෙසේ වෙතත්, ඉහත

එම ණය ලබා දී ඇත්තේ සමාගමට ලැබිය යුතු කල්පිරීමේ කාලය වසරකට වඩා වැඩි ක්ෂුද්‍ර මූල්‍ය ණයවලට එරෙහිව වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) විසින් අනුමත කර ඇත.

| | |
|---|---|
| කොන්දේසිවලට පටහැනිව, ආපසු ගෙවීමේ කාලය වසර 3 සිට 5 දක්වා ලබා දී ඇත. | |
| (iv) අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) අංක 1133/2020 දරණ පත්‍රිකාවේ අවදානම් කළමනාකරණ අංශය විසින් කරන ලද නිර්දේශවලට අනුව (ප්‍රතිලේඛණ ගත කරන අවස්ථාවේදී), මෙම ණයවල ඇප දුර්වල බවත් ඇප අවදානමක් ඇති බවත් සඳහන් කර ඇත. කෙසේ වෙතත්, ඉහත කරුණු නොසලකා හරිමින්, අහිතකර තත්ත්වයන් යන පදනම මත ණය අනුමත කර ඇති අතර පසුව එම ණය තුනම අක්‍රීය වී ඇත. ඒවා නැවත ප්‍රතිලේඛණගත කර තිබූ අතර පවත්නා සුරකුම් මත ප්‍රාග්ධන පමාසහනයන්ද (Capital moratorium) ද ඒ සමඟ ලබා දී ඇත. | ණය ගැනුම්කාර සමාගමේ ඉල්ලීම පරිදි ණය ගැනුම්කරු පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් සහ ණය ගන්නා සමාගමේ වත්මන් මූල්‍ය තත්ත්වය නංවාලීමේ අරමුණින් 2022.05.31 දින නැවත දෙවන ප්‍රතිලේඛනගත කිරීම සිදු කරන ලදී. පොදු උපදෙස් චක්‍රලේඛ අංක 734/2005 (17) හි චක්‍රලේඛ මාර්ගෝපදේශ අනුව පවතින සුරැකුම්පත් මත පදනම්ව මෙම පහසුකම් තුන සඳහා නැවත ප්‍රතිලේඛණගත කිරීම් සැකසීම සිදු කරන ලදී. එම නැවත ප්‍රතිලේඛණගත කිරීමේ අදියරේදී බැංකුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ කොවිඩ් 19 බලපෑමත් සමඟ සමාගම මුහුණ දී ඇති අවදානම් සලකා බලමින් ගණුදෙනුකරුගේ ආපසු ගෙවීම් කෙරෙහිය. අඛණ්ඩ සාකච්ඡා වලදී, නැවත ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීමට සුදුසු සුරැකුම් ලෙස නිශ්චල වත්කම් / වෙනත් වත්කම් අනාවරණය නොවීය. පවතින සුරැකුම්පත් මත යැපීම හැර බැංකුවට වෙනත් විකල්පයක් නොතිබුණි. |
| (v) ණය ගොනුවේ සඳහන් දත්ත අනුව මෙම ගණුදෙනුකරුගේ ණය අවදානම් ශ්‍රේණිගත කිරීම 2019 සිට 2022 දක්වා කාලය තුල 'BB' සිට 'C' දක්වා පිරිහී ඇත. | ණය අංශය විසින් සිදු කරන ලද ණය අවදානම් ශ්‍රේණිගත කිරීම අනුව, සමාගමේ ණය අවදානම් ශ්‍රේණිගත කිරීම "BB" සිට "C" දක්වා පහත වැටී ඇති අතර, එය අනුමත කරන බලධාරීන්ට දන්වා ඇත. |
| (vi) එකඟ වූ පරිදි පොලී නොගෙවීම හේතුවෙන් 2022 සැප්තැම්බර් 06 දින මෙම ණය අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර ඇත. ණය අයකිරීම් අත්පොතට අනුව මෙම ණය කාණ්ඩයට වසරක කාලයක් සඳහා ලබා දිය හැකිය. කෙසේ වෙතත්, සතුටුදායක අයකර ගැනීමකින් තොරව බැංකුව විසින් මුල් ණය ප්‍රදානය කළ දිනයේ සිට වසර 9 සිට 11 දක්වා ණය කාලසීමාව දීර්ඝ කර ඇත. ශක්තිමත් සුරකුම් ලබා නොගැනීම, නිසි ආපසු ගෙවීමේ සැලැස්මක් නොමැතිකම සහ දුර්වල ණය ඇගයීම මෙම ණය සම්බන්ධයෙන් වූ ප්‍රධාන දුර්වලතා ලෙස නිරීක්ෂණය විය. 2022 සැප්තැම්බර් 06 | ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය නැවත ඇති කිරීමේ අරමුණින් අභ්‍යන්තර අනුමැතියට යටත්ව මෙම ප්‍රතිලේඛණගත කිරීම සිදු කරන ලදී. මාසික වාරිකයේ වටිනාකම අඩු කරන ලෙස ණය ඉල්ලුම්කාර සමාගම ඉල්ලා තිබුණි. එබැවින්, සහනදායී මාසික වාරිකයක් ඉදිරිපත් කිරීම සඳහා කාලය නැවත වසර 6ක් දක්වා දීර්ඝ කරන ලදී. එය පොදු උපදෙස් චක්‍රලේඛ අංක 734/2005 (17) හි මාර්ගෝපදේශ සමඟ එකඟ වේ. ණය ප්‍රතිලේඛණගත කිරීමේ වැඩපිළිවෙලෙන් පසු ප්‍රාග්ධනය සහ පොලී ලෙස රු.මිලියන 51.93 ක ගෙවීම් ලැබුණි. ණය පහසුකම් අක්‍රීය කාණ්ඩයට අයත් වුවද ණය |

| | |
|---|---|
| දිනට මුළු අයවිය යුතු ශේෂය රු.මිලියන 422.61 ක් ලෙසට වාර්තා වී ඇති අතර රු.මිලියන 417.92 ක ප්‍රාග්ධන ශේෂය ඊට ඇතුළත් විය. | ඉල්ලුම්කාර සමාගමෙන් ණය අයකරගැනීම, ප්‍රතිලේඛණගත කිරීමේ ප්‍රධාන අරමුණ විය. |
| (vii) කිසිදු ණය ශේෂයක් නොතිබුණද, එම ගණුදෙනුකරු සඳහාම ගණුදෙනුකරු හැඳුනුම් අංක (CIF) 05 ක් නිරීක්ෂණය කරන ලද අතර තොරතුරු පහත පරිදි වේ.<br>450012095,1740003288,<br>2240046224, 680023200 | 2023.12.31 ට පෙර මෙම ගණුදෙනුකරු හැඳුනුම් අංක (CIF) සියල්ල සාමාන්‍යකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (viii) ඉහත සමාගමේ ව්‍යාපාර බලපත්‍රය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇති අතර ඒ අනුව ඉහත ණය ආපසු අයකර ගැනීම ගැටලුකාරී වේ. | ණය පහසුකම් ආපසු අයකර ගැනීමේ හැකියාව මුළුමනින්ම රඳා පවතින්නේ දයා ගෲප් (පුද්) සමාගමේ ආයතනික ඇපකරය මතය. ණය ගැනුම්කරුට සහ ආයතනික ඇපකරුට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. බංකොලොත් සමාගමක ණයපොත් සම්බන්ධයෙන් උකස් බැඳුම්කරයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම ප්‍රායෝගික නොවන බැවින්, බැංකුව කිසිදු උකස් බැඳුම්කර ක්‍රියාමාර්ගයක් ගොනු කර නොමැත. එම ප්‍රතිලේඛණගත කිරීම තුල, බැංකුවට ප්‍රාග්ධනය සහ පොලී ලෙස සැලකිය යුතු මුදලක් අයකරගත හැකි විය. මුදල් ආපසු අයකරගැනීමේ ක්‍රියාව සහ ගණුදෙනුකරු සමඟ සාකච්ඡා කිරීම තුලින් ශේෂය අයකර ගනු ලැබේ. |
| 1.5.2.9. ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම සඳහා ලබා දුන් ණය මුදල.<br>දයා ගෲප් (පුද්) සමාගමේ අනුබද්ධිත සමාගමක් ලෙස 2007 දී දයා කන්ස්ට්‍රක්ෂන්ස් (Daya Constructions) නමින් ස්ථාපිතව ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (Olympus Constructions) ලෙස 2014 දී නැවත සංස්ථාගත කරන ලද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරත වූ ව්‍යාපාරයකි. 2021 දෙසැම්බර් 31 දිනට ණය කළඹේ විස්තර අනුව රු. මිලියන 581.63ක් (ප්‍රාග්ධනය රු. මිලියන 518.12, උපචිත පොලිය රු. මිලියන 57.42, දඩ පොළිය සහ ප්‍රමාද ගාස්තු රු. මිලියන 6.019) දක්වා එකතු වූ ණය ගිණුම් 07ක් ගණුදෙනුකරුගෙන් ලැබිය යුතු ලෙස සටහන් විය. පහත නිරීක්ෂනය කෙරේ. | |
| **(i)** ව්‍යතිරේක කොන්දේසි මත අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) අනුමැතිය ඇතිව මෙම ණය ප්‍රදානය කර ඇති අතර බොහෝ ප්‍රතිලේඛණගත කිරීම්වලින් පසුව ලියාහැරීම් (waive - off) කිහිපයක් ද අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය | ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන්ස් හි ඉහත සඳහන් උපචිත පොලිය ලියාහැරීමේ (waive off) යෝජනාව BP 962/2021 මඟින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br>මූලික වශයෙන්, අක්‍රීය ණය හා අත්තිකාරම් ප්‍රතිලේඛණගත කිරීම සඳහා නිකුත් කරන ලද සාමාන්‍ය උපදෙස් චක්‍රලේඛ අංක 734/2005(17) මඟින් |

කමිටුව (BECC) විසින් අනුමත කර ඇත. විගණනයට ඉදිරිපත් කරන ලද විස්තර අනුව, රු. මිලියන 33.13 ක සම්පූර්ණ ලියාහැරීම් (waive - off) සේවාදායකයාට ලබා දී ඇත.

1.5.2.10. ඩබ්.එම්.මෙන්ඩිස් සමාගම සඳහා ලබා දුන් ණය මුදල

2020 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් ඉහත ගනුදෙනුකරුට ප්‍රදානිත මුළු ණය මුදලෙහි වටිනාකම රු. මිලියන 3,063 කි.

(i) බැංකුවේ ණය මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි පරිච්ඡේද අංක 5 හි 12 වැනි ඡේදයට අනුව, කිසියම් ණයක් ලබා දීමට පෙර අක්‍රීය ගණයෙහි ණය නොමැති බව සහතික කිරීම සඳහා ගණුදෙනුකරුගේ වගකීම් වාර්තා පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත කරුණුවලට පටහැනිව, බැංකුව විසින් ඉහත ගනුදෙනුකරුට රු. මිලියන 378 ක ණය 3 ක් ලබා දී ඇත.

(ii) 2021 ජූනි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) පත්‍රිකා අංක 708/2021 අනුව, අයකර ගත යුතු ප්‍රාග්ධනය රු. මිලියන 3,062.7 ක් සියයට 9.75 ක පොලියකට වසර 7 ක් දක්වා (මාස 18 ක ප්‍රාග්ධන පමාසහන කාලයක් සහිතව) ණය 4 කට ප්‍රතිලේඛණගත කර ඇති අතර රු. මිලියන 806.9ක හිඟ පොලී

සුවිශේෂී අවස්ථා මත උපචිත පොලී සංරචකයෙන් 30% කල් දැමීමටද යෝජනා කර ඇත.

සමාගම අක්‍රීය ගනුදෙනුකරුවකු ලෙස වර්ගීකරණය කළ අවස්ථාවේ පහත සඳහන් සාධක සැලකිල්ලට ගනිමින් පහසුකම් සලකා බලන ලදී.

- SCB අරමුදල් සමඟ ඉදිකිරීම් ආරම්භ කර ඇති ENA බලාගාරයේ ද්විතියික උකස් ක්‍රියාත්මක කිරීමෙන් එහි වෙළඳපල වටිනාකම තුලින් සුරැකුම් ශක්තිමත් කිරීම සහ කාලයත් සමඟ විය හැකි අගය වැඩි වීම.
- කෙටිකාලීන මූල්‍ය පහසුකම් චක්‍රියකිරීම මත අනාගත අයකිරීම් වර්ධනය සඳහා ණය මෙහෙයුම් අත්පොතේ උපලේඛණ 04- CBD/OBU දෙපාර්තමේන්තු නිලධාරීන් හට 120% අයකිරීම් පදනම මත වෙළඳ මූල්‍ය පහසුකම් ලබා දීමට බලය දීම පරිච්ඡේද අංක 02 අනුව (අනුමත ණය අධිකාරිය) .
- අක්‍රීය ණය කළඹ අඩු කිරීම සඳහා ඉහළ අයකිරීම් අනුපාතයක් යටතේ කෙටිකාලීන ණය චක්‍රියකරණය කිරීම.

ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිසාධන සැලැස්මක් සඳහා අවශ්‍ය මෙහෙයුම් දිගටම කරගෙන යාමට සමාගමට සහාය වීම.

ණය ප්‍රතිලේඛණය කිරීම මඟින් ණය ගිවිසුම ශක්තිමත් කිරීම සඳහා නැවත සැලසුම් කිරීම සිදු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) පත්‍රිකා අංක 708/2021 අනුව බැංකු අයිරා පහසුකම් සඳහා වසරකට සියයට 24 බැගින් උපචිත රු. මිලියන 1,051 න් රු. මිලියන 400 ක පොලී සහනයක් ලබා දෙන ලදී. මෙය 2021 ජූලි 19 දිනැති පිරිනැමීමේ ලිපියේ (Offer Letter) ඇතුළත් කර ඇති අතර, මෙම

සහ දඩ පොලිය වසර 3ක් දක්වා සියයට 9.75ක පොලියට ණය 4ක් ලෙස ප්‍රතිලේඛණගත කර ඇත.

(අ)2021 ජුනි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) පත්‍රිකාවේ අංක 708/2021 හි 9 වැනි ඡේදයට අනුව, අයිරා පහසුකම් සඳහා වූ රු. මිලියන 400 ක පොලිය "කල් තැබීම හා පසුව ලියාහැරීම" (Differ and later waive off) ලෙස ඉවත් කර ණය ප්‍රතිලේඛණගත කර ඇත.

(ආ.) ඉහත අධ්‍යක්ෂ මණ්ඩල විධායක කමිටු (BECC) පත්‍රිකාවේ 11.4 වගන්තියට අනුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ පුද්ගලික ඇපකර ලබා ගැනීම නිර්දේශ කර ඇත. ඒ අනුව, රු.මිලියන 1,632.2ක ණය ගිණුම් 7ක් සඳහා පමණක් අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපකර සහ පොරොන්දු පත්‍ර ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඇප සහතික කරන ලද අධ්‍යක්ෂවරුන් රු.මිලියන 100 බැගින් වූ කොටස්වල වටිනාකම පමණක් අංක 149 පෝරමය හරහා ඉදිරිපත් කර තිබූ අතර එයට අදාල සාක්ෂි පවා බැංකුව විසින් ලබාගෙන නොතිබුණි.

(ඇ.)රු.මිලියන 3,869.2 ක ප්‍රාග්ධනය සහ රු.මිලියන 507.6 ක පොලී ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට ඉහත ගනුදෙනුකරු විසින් රු. මිලියන 4,376.86 ක මුළු ශේෂයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, පවතින සුරැකුම්වල වටිනාකම වන රු.මිලියන 1,912.8, (2022 ඔක්තෝබර් 04 වන විට) ණය වටිනාකමෙන් සියයට 43.7 ක් පමණක් අයකර ගැනීමට ප්‍රමාණවත් බව නිරීක්ෂණය විය.

1.5.2.11. පී.සී.හවුස් ආයතන වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම්

රු. මිලියන 180 ක භාර කුවිතාන්සිවල (Trust Receipt) උප සීමාව සමඟ රු. මිලියන 200 ක ආනයන පහසුකම ඉහත සඳහන් ගණුදෙනුකරුට ලබා දී තිබූ අතර පසුව සහනයට අවසර දෙනු ලැබුවේ ආපසු ගෙවීම් සතුටුදායක ලෙස සිදු කරන්නේ නම් පමණි.

දැනට ක්‍රියාත්මක වන කල්කුඩා බලාගාරයේ ද්විතියික උකස සහ මොරොගොල්ලේ ප්‍රාථමික උකසට අමතරව ප්‍රතිලේඛණගත කරන ලද ණය අට (08) සඳහා පුද්ගලික ඇපකර සහ පොරොන්දු නෝට්ටු ලබාගෙන ඇත.

ණය ප්‍රතිලේඛනගත කිරීමේ වැඩසටහන යටතේ යෝජිත ප්‍රාග්ධනිත කරන ලද උපචිත පොලී ණය ඇතුළුව මුළු ප්‍රාග්ධන ශේෂය වැඩි වී ඇත. පුද්ගලික ඇපකරුවන්ගේ වත්කම් ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රවල ඇපකරුවන්ගේ වත්කම් පදනම පැහැදිලිව සඳහන් කර නොමැත. කෙසේ වෙතත්, කල්කුඩා එතනෝල් නිෂ්පාදන කම්හලේ ක්‍රියාකාරීත්වය ආරම්භ කිරීම හේතුවෙන් සමාගමේ වත්කම් පදනම සැලකිය යුතු ලෙස ඉහළ යමින් පවතී.

සමාගමට ඇති අවදානම හේතුවෙන් එය රු. මිලියන 121 ක් දක්වා අඩුකර ඇත. කෙසේ වෙතත්, අනුමත පහසුකම 2009 අගෝස්තු 30 දිනෙන් කල් ඉකුත් වී තිබූ අතර හිඟ ශේෂයන් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කරන ලදී. ඒ අනුව, බැංකුව විසින් අක්‍රීය භාර කුවිතාන්සි (Trust Receipt) ණය, 2009 දෙසැම්බර් 24 දින අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) අංක 678/2009 පත්‍රිකාවේ අනුමැතියට යටත්ව ප්‍රතිලේඛණ ගත කරන ලදී. ප්‍රතිලේඛණ ගත කරන ලද අවස්ථාවේදී, බැංකුව විසින් රු. මිලියන 15 ක තොග ණය මුදලක්, රු. මිලියන 15.5 ක චංචල දේපල දෙකක උකසකට යටත්ව ලබා දී ඇත. පවතින භාර කුවිතාන්සි (Trust Receipt) පහසුකම් සීමාව රු. මිලියන 106ක් (ණයවර ලිපි හි උප සීමාව රු. මිලියන 30ක් සමඟ) දක්වා අඩු කර වසරක කාලයක් සඳහා යාවත්කාලීනකර ඇත. රු.මිලියන 106ක භාර කුවිතාන්සි (Trust Receipt) පහසුකම, බද්ධ හා වෙන් වෙන් වශයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ඇපකර සහ මට්ටක්කුලිය, යුනිටි ප්ලාසා සහ මැජෙස්ටික් සිටි හි රු. මිලියන 210ක විකුණුම් වටිනාකමක් සහිත (FSV) තොග උකස ණය මුදලෙහි සුරැකුම් ලෙස පවතී. අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) පත්‍රිකා අංක 678/2009 අනුව, සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයක් ගොනු කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති බැවින් ප්‍රතිලේඛණගත කිරීමේ යෝජනාව නිර්දේශ කර ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(i) බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගේ බද්ධ සහ වෙන් වෙන් වශයෙන් ඇපකර යටතේ සහ ණය ලේඛනවලට එරෙහිව නඩු අංක HC/සිවිල්/321/2013/MR යටතේ නඩුවක් ගොනු කර තිබුණි. තීන්දුව බැංකුවට පක්ෂව ලබා දුන්නද, එම තීන්දුවට එරෙහිව සමාගම ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

බැංකුවට පක්ෂව තීන්දුව දෙන ලදී. එම තීන්දුවට එරෙහිව සමාගම ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර අභියාචනය තවමත් ලැයිස්තුගත කර නොමැත.

2018 ජනවාරි 26 වැනි දින බැංකුව විසින් උකස් කරන ලද දේපළ දෙක සඳහා පරාටේ (parate) ක්‍රියාත්මක කර ඇති අතර සාර්ථක ලංසුකරුවන් නොමැති බැවින් දේපළ නැවත බැංකුව වෙත පවරා දෙන ලදී. එම වසර තුළම එම දේපළ රු. මිලියන 47.75 කට ටෙන්ඩර් මඟින් විකුණා ණයෙන් කොටසක් අයකර ගන්නා ලදී.

2023 අගෝස්තු 31 දිනට ශේෂය – ප්‍රාග්ධනය රු. මිලියන 63.88, සාමාන්‍ය පොලිය - රු. මිලියන 110.71, දඩ පොලිය රු. මිලියන 32.01 කි.

(ii) 2012 සැප්තැම්බර් 17 දිනැති බැංකුවේ අනුමත තක්සේරුකරුවන්ගේ තක්සේරු වාර්තාවට අනුව, මට්ටක්කුලිය සහ යුනිටි ප්ලාසා හි තොගයෙහි විකුණුම් වටිනාකම (Forced Sale Value) රු. මිලියන 149 කි. එම තොග උකස මත ප්‍රදානිත භාර කුවිතාන්සි (Trust Receipt) පහසුකම්

අදහස් සටහන් කරගන්නා ලදී.

අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට එරෙහිව විනය පියවර ගන්නා ලදී.

ඉදිරියේදී නියමිත මාර්ගෝපදේශ පිළිපැදීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

සුරක්ෂිත කර ඇතත්, අක්‍රීය ණය ආපසු අයකර ගැනීම සඳහා කිසිදු තොගයක් උපලබ්ධි කර ගැනීමට බැංකුව අසමත් විය. එබැවින්, එකී පහසුකම් 2022 සැප්තැම්බර් 30 වන විට ඉතිරිව තිබූ අතර, උපලබ්ධි කළ හැකි සුරැකුම්පත් නොමැති බැවින්, රු. මිලියන 196.3 ක මුළු ශේෂය බැංකුවට පාඩුවක් විය හැකිය.

(iii) අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ වෙන් වෙන් වශයෙන් ඇපකර මත භාර කුවිතාන්සි (Trust Receipt) ණය ලබා දී ඇත. ණය මෙහෙයුම් අත්පොතෙහි 5.9.4 වගන්තියට අනුව, එක් එක් ඇපකරුට ණය ආපසු ගෙවීමට හැකියාව තිබේද යන්න සහතික කිරීම සඳහා ඇපකරුවන් සතු වත්කම් ලැයිස්තුවක් ලබා ගැනීම සහ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රකාශිත වත්කම් බැහැර නොකිරීමට ලිඛිත ගිවිසුමක් ලබා ගැනීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, විගණනය සඳහා එවැනි ලේඛන ඉදිරිපත් වී නොතිබුණි.

## 1.6. බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 1.6.1. දින වන විට හර බද්ද 31 දෙසැම්බර් 2022 අහෝසි කර තිබුණද, 31 දෙසැම්බර් 2022 දිනට බැංකුවේ සවිස්තරාත්මකමූලා තත්ත්ව ප්‍රකාශයේ ගෙවිය යුතු බදු ශේෂය රු8,537,114 .ක් විය. | 2019 දී අහෝසි කිරීමෙන් පසු එකතු කරන ලද හර බදු පිළිබඳ උපදෙස් ඉල්ලා 2023 මාර්තු 15 දින කොමසාරිස් ජනරාල් වෙත ලිපියක් යවන ලදී. | නිකුත් කරන ලද චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| 1.6.2. අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද අඩුවෙන් ගෙවීම )APIT). අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු බැංකුව විසින් මාසිකව ගෙවා තිබුණිගෙවිය යුතු . මුදලගණනය සඳහා දැනටමත් ගෙවා ඇති APIT මුදල යම් මාසයක APIT ගණනය කිරීමකින් අඩු කරනු ලැබේ. 2022 සැප්තැම්බර් මාසය සඳහා APIT ගණනය කිරීමේදී, අප්‍රේල් සිට අගෝස්තු දක්වා ගෙවා ඇති APIT මුදල රු . 17,853,140 ලෙස දක්වා ඇත. කෙසේවෙතත්, අගෝස්තු මාසයේ ගණනයට අනුව, 2022 අගෝස්තු මස අවසන් වන විට සමුච්චිත අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු )APIT) ගෙවිය යුතු | සටහන් කර ගන්නා ලදීනියමිත අනුමත . යාවලියෙන් පසු කෙටිකලක් තුළ ගෙවනු ක්‍රි මෙය නැවත නැවත .ලැබේසිදු නොවන එක් වර දෝෂයකි. | |

ශේෂය රු .11,902,093 කිමේ . හේතුවෙන් අත්තිකාරම් පුද්ගලික ආදායම් .බදු වියදම සහ ගෙවිය යුතු ශේෂය රු 6,433,878 කින් අවප්‍රමාණය වී ඇත .(බදු මත බදු ඇතුළුව).

1.6.3. 2014 ජූනි 23 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1868/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සේවා මත එකතු කළ අගයමූල්‍ය - .මත බද්ද

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්දට අදාළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 2014 ජූනි 23 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1868/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන 02 (ඇඅනුව (, ගෙවිය යුතු සේවක ප්‍රතිලාභ යන්නට සේවකයාට මුදලින් හා මුදලින් නොවන ගෙවිය යුතු දෑ ඇතුළු සමස්ථ ප්‍රතිලාභයන් ඇතුළත් වේ. එමනිසා, ආයතනය විසින් සේවකයාට ලබා දෙන මුදල් නොවන අකාරයේ ප්‍රතිලාභ ද සලකා බැලිය යුතුය. කෙසේ වෙතත්, මූල්‍ය සේවා මත වැට් බද්ද ගණනය කිරීමේ දී මුදල් නොවන ප්‍රතිලාභ බැංකුව විසින් සේවානියුක්ති ආදායම ලෙස සැලකා බලා නොමැත . .එබැවින් වියදම් සහ වගකීම රු 39,603,848 කින් අඩුවෙන් සටහන් කර ඇති බවට නිරීක්ෂණය විය.

1.6.4. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද 2018 ජූනි 20 දිනැති ලිපි අංක :MF/FP/13/CM/2018/82 - මූල්‍ය නොවන ප්‍රතිලාභ මත අත්තිකාරම් පුද්ගලික ආදායම් බදු.

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් නිකුත් කරන ලද 2018 ජූනි 20 දිනැති ලිපියේ අංක :MF/FP/13/CM/2018/82 ලිපියේ 4 (2) වගන්තියට අනුව,

පෙන්වා දී ඇති වෙනස්කම් සඳහා හේතු පහත පරිදි වේ;

1. වෘත්තීය ආයතන සඳහා වාර්ෂික දායකත්ව ගෙවීම, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බැංකුවේ බලපත්‍ර ගෙවීම සහ CEFT වෙත බැංකුවේ දායක මුදල් ලෙස රු මිලියන .38 ක් මෙහි අඩංගු වන අතර ශේෂය රු මිලියන .6.5 දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව සමඟ මූල්‍ය ප්‍රකාශන මත එකතු තළ අගය මත බදු පියවීමේ ක්‍රියාවලියේදී දීමනාව ලෙස සලකනු ලැබේ.
2. බැංකු ආරක්ෂක නිලධාරීන් වැනි නිල ඇඳුම් සඳහා මැසෙන්ජර්ස් යුනිෆෝම් ගිණුම හර කර ඇත. මෙම නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ පුද්ගලික ප්‍රතිලාභ විය නොහැකි අතර ඔවුන් එය පැළඳිය යුත්තේ බැංකු පරිශ්‍රයේ පමණි.
3. යැපුම් සහ නවාතැන් සහ කාර්ය මණ්ඩලය ගමන් කිරීම යනු බැංකුවේ කාර්යාල අරමුණ සඳහා වියදම් ප්‍රතිපූරණය කිරීමයින්තර අභ්‍ය .උදා . විගණකවරුන් විසින් ශාඛා පරික්ෂා තිපූරණය කිරීමසඳහා වියදම් ප්‍ර.
4. සමහර ශාඛාවන් විසින් අක්‍රීය ණය අයකර ගැනීමේ අරමුණු සඳහා බාහිරින් සේවා සපයන්නන් භාවිතා කළ අතර අක්‍රීය ණය අයකර ගැනීමේ දිරි දීමනා ලෙස ඔවුන්ට ගෙවීම් සිදු කරනු ලැබේ.
5. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය ' -C' - විශ්‍රාමිකයන්ට වෛද්‍ය ගාස්තු ගෙවීම සඳහා භාවිතා කරනු ලබයි.

CGIR 2018/2019 තක්සේරු වර්ෂය සඳහා පමණක් සහනදායී ණය අනුපාතය 9.08% ලෙස ප්‍රකාශයට පත් කර ඇත .2022/2023 තක්සේරු වර්ෂය සඳහා වෙළඳපොළ ණය අනුපාතය සහ සහනදායී ණය අනුපාතිකයේ 50% වෙනසෙහි මුදල් නොලබන ප්‍රතිලාභය ගණනය කිරීමේදී යොදාගතයුතු අනුපාතිකය හඳුනාගත නොහැක.

සහනදායී ණය අනුපාතිකය සහ වෙළඳපල ණය අනුපාතය අතර වෙනසෙන් සියයට 50 ක් මූල්‍ය නොවන ප්‍රතිලාභ ලෙස සලකා බලනු ලබයිමේ . අනුව, මහජන බැංකුව විසින්, 2022 වසර සඳහා එහි සේවකයින්ගේ අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද තක්සේරු කිරීමේදී සහනදායී ණය පොලී මත මුදල් නොවන ප්‍රතිලාභය සලකා බලා නොතිබුණි.

දේශීය ආදායම් චක්‍රලේඛ අංක : SEC/2020/02 හි 2 වන වගන්තියට අනුව, නිවැරදි භාවිතය 2023 ජනවාරි 1 සිට ආරම්භ විය.

1.6.5. 2020 දෙසැම්බර් 18 දිනැති දේශීය ආදායම් චක්‍රලේඛ අංක :SEC/2020/02

2020 දෙසැම්බර් 18 දිනැති දේශීය ආදායම් චක්‍රලේඛ අංක :SEC/2020/02 හි 2 වැනි වගන්තියට අනුව, විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත ගෙවීම් රු .5,000,000 ඉක්මවන විට සේවා යෝජකයෙකු එම ගෙවීම් වලින් සියයට 12 ක් රඳවාගත යුතුයකෙසේ වෙතත් ., බැංකුව ඉහත චක්‍රලේඛයට අනුගත වී නොමැති අතර රු. 5,000,000 ඉක්මවන මුදලින් සියයට 12ක් රඳවා නොගෙන සම්පූර්ණ විශ්‍රාම වැටුප සහ පාරිතෝෂිකය නිදහස් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විශ්‍රාමික පුද්ගලයන් 08 දෙනෙකුගේ නියැදියට අදාළව රු .1,050,445 ක මුදල බැංකුව රඳවාගෙන නොතිබුණි. එබැවින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ PAYE විගණන ශාඛාවේ උපදෙස්වලට පටහැනිව බැංකුව විසින් රඳවාගත යුතු මුදල නිදහස් කර ඇත. එම දුර්වලතාවය හේතුවෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අයකිරීමේ ක්‍රියාපටිපාටිය උල්ලංඝණය වී ඇති අතර, ඒ හේතුවෙන්, විශ්‍රාම වැටුපෙන් සහ පාරිතෝෂිතයෙන් කරන ලද බදු අඩු කිරීම මඟ හැරීමට එය හේතුවක් වී ඇත.

බැංකුවේ පූර්ව පරිචය සහ මෑතකදී සාර්ථකව අවසන් කරන ලද දේශිය ආදායම් දෙපර්තුමේන්තුවේ පූර්ව වර්ෂවල බදු පියවීම් සැලකිල්ලට ගනිමින්, LIBOR අනුපාතය මත පදනම්ව පහත සඳහන් දෑ පමණක් නැවත එකතු කිරීමට දෙපාර්තමේන්තුව දැනටමත් පිළිගෙන ඇත:

- ස්වෛරීත්ව බැඳුම්කර ආදායම
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත වූ පොලී ආදායම
- LIBOR අනුපාතය මත විදේශ ණය සඳහා පොලිය යන ඒවාට අදාළ පොලී පිරිවැය

1.6.6. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 11 වැනි වගන්තිය ධාන අඩු ප්‍ර) (කිරීම

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 11 වැනි වගන්තිය ධාන අඩු ප්‍ර) කාරවප්‍ර (කිරීම, ව්‍යාපාරයෙන් හෝ ආයෝජනයෙන් ලැබෙන ආදායම් නිෂ්පාදනයේදී පුද්ගලයා විසින් වර්ෂය තුළ දරන ලද ප්‍රමාණයට අනුව වියදම් අඩු කළ යුතුයඑබැවින් ., නිදහස් කරන ලද

ආදායම උත්පාදනය කිරීම සඳහා දරන ලද වියදම්, වියදම් වලින් ඉවත් කර ආදායම් බදු නීතියට අනුව ආදායම් බදු ගණනය කිරීමේ ලාභයට නැවත එකතු කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව විසින් පරිපාලන වියදම්, පොදු කාර්ය වියදම්, සේවක පිරිවැය සමානුපාතිකව ඉවත් කර නොතිබූ අතර එය විදේශ මුදල් ඉපැයීමේ නිදහස් ආදායමක් ස්වෛරී ) බැඳුම්කර ආදායම, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පොළිය සහ විදේශ ණය සඳහා පොලිය.ඉපයීමට දායක විය ( එම දුර්වලතාවය නිසා ගෙවිය යුතු ආදායම් බදු සහ වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.7. 2006 අංක 12 දරන මුද්දර ගාස්තු ශේෂ වි) .පනත (විධිවිධාන

2006 අංක 12 දරන දේශීය ආදායම්, මුද්දර ගාස්තු පනතට (විශේෂ විධිවිධාන) අනුව, පොරොන්දු නෝට්ටු සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ප්‍රමාණය සෑම වසරකම, අදාළ කාර්තුව අවසානයේ සිට දින 15ක් ඇතුළත මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 කොමසාරිස් ජනරාල්වරයා වෙත කාර්තුමය වශයෙන් ප්‍රේෂණය කර යුතුය. කෙසේ වෙතත්, සමහර ශාඛා මෙම පනතේ ඉහත සඳහන් විධිවිධානයට අනුකූල වී නොතිබුණි.

අදහස් සටහන් කර ගන්නා ලදී. මුද්දර ගාස්තු දැනට ප්‍රමාදයකින් තොරව දේශීය ආදායම් වෙත ප්‍රේෂණය කෙරේ. නියමිත මාර්ගෝපදේශ පිළිපැදීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

## 2. මූල්‍ය තොරතුරු සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 21,338.4 ක් වූ අතර පෙර වසරේ අනුරූප ලාභය රු. මිලියන 30,386.6 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 9,048.2 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පිරිහීමට හේතු වූයේ පොලී වියදම් ඉහළ යාම සහ හානිකරණ වියදම් ඉහළ යාමයි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) (රු.000) | විචලනය% | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 124,605,972 | 63.15 | පොලී අනුපාත ඉහළ යාම |

| | | | |
|---|---|---|---|
| පොලී වියදම | 131,308,747 | 114.31 | පොලී අනුපාත ඉහළ යාම |
| හානිකරණ වියදම | 18,873,631 | 130.41 | අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය වැඩි වීම සහ ආර්ථික සාධකයන්ගේ වූ බලපෑම |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ බැංකුවේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | ආංශික අනුපාතය | බැංකුව 2022 | බැංකුව 2021 |
|---|---|---|---|
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 10.5 | 12.2 | 19.9 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 1.0 | 0.8 | 1.2 |
| පොලී ආන්තිකය | 4.0 | 2.7 | 3.4 |
| **වත්කම් ගුණත්ව අනුපාතය** | | | |
| හානි කළ ණය (අදියර 3) අනුපාතය | 11.3 | 12.8 | 4 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 8.5%) | 12.3 | 11.9 | 12.6 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14%) | 18.3 | 16.3 | 17.8 |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය 20%) | 29.9 | 21.37 | 23.52 |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාවය 100%) | | රුපියල් – 213<br>සියලු මුදල්– 119.47 | රුපියල් - 155.83<br>සියලු මුදල් - 105.71 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ආර්ථික නොවන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **දත්ත ගබඩාව සහ ව්‍යාපාර බුද්ධි පද්ධති ව්‍යාපෘතිය.**<br>2022 මැයි 30 වන විට බැංකුව විසින් රු . 402,026,172 (බදු පෙරපෘතිය ඉහත ව්‍යා ( පෘතිය නිම කර සඳහා දරන ලද අතර ව්‍යා නොතිබුණි. යෝජිත මොඩියුල 11න්, මොඩියුල 4ක් පමණක් ]DW & DQ I Module, DW & DQ II Module (වාර්තා 5ක් පමණක්(, මෙහෙයුම් අවදානම් මොඩියුලය, වෙළඳපළ අවදානම් මොඩියුලය] සජීවීව ගොස් ඇති අතර එම මොඩියුලවලද අපේක්ෂිත | කළමනාකාරිත්වය විසින් ගන්නා ලද තීරණය මත පදනම්ව, දත්ත ගබඩාකරණ ව්‍යාපෘතිය අවසන් කරන ලදී.<br>ඒ අනුව රු .137,187,229.88 ක වෙන්කිරීමක් මේ සම්බන්ධයෙන් සිදුකර ඇත. | බැංකු අරමුදල් ඵලදායී හා කාර්යක්ෂම භාවිතය සහතික කිරීම සඳහා හා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය . තවද, බැංකුවට කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව සැලකිය යුතු පිරිවැයක් දැරීමෙන් පසු අත්හිටුවන ලද දත්ත ගබඩාව සහ ව්‍යාපාර බුද්ධි පද්ධති ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු කර එම |

| | | |
|---|---|---|
| ප්‍රතිඵල පරිශීලකයන් වෙත ලබා දී නොමැතතවද., මෘදුකාංග බලපත්‍රය 2020 වර්ෂයේදී කල් ඉකුත් වී ඇති බවත්, දැනට සම්පූර්ණ කරන ලද මොඩියුල ද ක්‍රියාත්මක නොවන බවත් නිරීක්ෂණය විය. | | පිරිවැය අයකර ගැනීමට හෝ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2022 වසර සඳහා බැංකුවට මුළු පාඩු ලෙස රු. මිලියන 159.1 ක මුදලක් වාර්තා කර ඇත. ඉහත ශේෂයෙන් සැලකිය යුතු මුදලක් වූ රු. මිලියන 83.31 ක් ක්‍රියාත්මක කිරීම, බෙදාහැරීම සහ ක්‍රියාවලි කළමනාකරණයෙන් සමන්විත වූ අතර ප්‍රධාන වශයෙන් ශාඛා හතරක සාමාන්‍ය ලේජරවල රු. මිලියන 38.1 ක backlog අතපසු වූ ශේෂයන් නිවැරදි කිරීම සහ 2022 වර්ෂය තුළ මෙහෙයුම් අලාභ වෙත මාරු කරන ලද පෙර වසරවල දිගුකාලීන හිඟ මුදල් රු. මිලියන 36.8 කි. තවද, සමස්ත පාඩු අතර ශාඛා 4 ක සිදු වූ රු. මිලියන 41.59 ක අභ්‍යන්තර වංචා ඇතුළත් වේ. | අදහස් සටහන් කර ගන්නා ලදී. බැංකුව විසින් වර්තමානයේදී විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇත. නියමිත මාර්ගෝපදේශ පිළිපැදීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හා අදාල පාර්ශව වෙතින් පිරිවැය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මතභේදාත්මක ස්වභාවයේ ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 3.3.1. බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ 06 වන පරිච්ඡේදයේ 9 (ආ වගන්තිය (අනුව, භාණ්ඩ සමීක්ෂණය කර හඳුනා ගැනීමෙන් පසුව සහ විධායක මෙහෙයුම් කමිටු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෝටර් රථ බැහැර කිරීම සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් සහ තක්සේරු වාර්තා ලබා නොගෙන පහත සඳහන් වාහන ආයතනික කළමණාකාරීත්ව සාමාජිකයින්ට විකුණා ඇත.<br>වාහන අංකය / මිලදී ගත් වර්ෂය / බැහැර කළ දිනය<br>WP CAY – 6974 / 2018.03.22 / 2018.10.31 | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 05/2018 තීරණයට අනුව බැංකුව සමඟ ඔවුන්ගේ දිගුකාලීන හා කැපවූ සේවාව සලකා බලා ඔවුන්ගෙන් කිසිවකුට බැංකුවේ සේවය කිරීමට ඉදිරි වසර දෙකක් නොතිබුණද, වසරකට පමණ පෙර බැංකුව විසින් මිලදී ගෙන තිබූ වාහන මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 51/2018 අනුමත ණය යෝජනා ක්‍රමය යටතේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් තිදෙනාට ණය ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත. | ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ කිසිදු අපගමනයකින් තොරව පිළිපැදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| WP CAY – 6992 | 2018. 03.22 | 2019.03.14 |
| WP CAY – 6994 | 2018.03.23 | 2019.03.21 |

| | | |
|---|---|---|
| 3.3.2. 2018 පෙබරවාරි 08 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ, 2018 මාර්ගෝපදේශ අංක 01 හි 2 වගන්තිය අනුව, උපරිම ණය මුදල උකසට තබා ඇති දේපලෙහි වෙළඳපල වටිනාකමේ නිශ්චිත ප්‍රතිශතයට සීමා කළ යුතුයකෙසේ වෙතත් ., ඉහත උපදෙස් වලට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 51/2018 පත්‍රිකාව හරහා ලබා දී ඇති අනුමැතිය යටතේ වාහනයේ ඉන්වොයිස් වටිනාකමෙන් සියයට 100 ක් ආයතනික කළමණාකාරිත්ව සාමාජිකයින් සඳහා වාහන ණය ලෙස ලබා දී ඇත. | BHRRC 51/2018 යටතේ හඳුන්වා දී ඇති විශේෂ වාහන ණයට අනුව, නව වාහන සඳහා පමණක් ණය සලකා බැලිය හැක. එබැවින් අදාළ තනතුරට අදාළ සීමාවන්ට යටත්ව මිලදී ගැනීමේ වටිනාකමෙන් 100%ක් දක්වා ඉන්වොයිස් වටිනාකම ණය මුදල ලෙස සලකන ලදී. | |
| 3.3.3. 2019 වර්ෂයේදී පැවති කෝප් රැස්වීමේදී, ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින්ට ප්‍රවාහනය සැපයීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍ය බව අවධාරණය කරන ලද අතර, ඒ අනුව, 2019 සැප්තැම්බර් 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 723/2019 මගින් ගත් තීරණය අනුව, නිල භාවිතය සඳහා බැංකුව මගින් නඩත්තු කරනු ලබන වාහනයක් ලබා දීමට සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 51/2018 යටතේ අනුමත කර ඇති ප්‍රතිපත්තිය වහාම අත්හිටුවීමට තීරණය කර ඇත . තවද, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 51/2018 පත්‍රිකාව හරහා අනුමත ප්‍රතිපත්තිය යටතේ ණය ලබාගෙන ඇති අයට, ඔවුන් දැනටමත් වාහන මිලදී ගෙන ඇති බැවින් වාහන ලබා නොදේ . මය යටතේ ඉහත කී ණය යෝජනා ක්‍ර ලබා දී ඇති ණය16 පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරන ලදී.<br><br>I. අර්පණ ලිපියේ සහ එකඟතා ලිපියේ දක්වා ඇති කොන්දේසි අනුව, විශ්‍රාම | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 51/2018 අනුව සඳහන් කළ ණය පහසුකම් ලබා දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 723/2019 අනුව යෝජනා ක්‍රමය අවලංගු කළ නමුත් 51/2018 යටතේ දැනටමත් ණය පහසුකම් ලබාගෙන ඇති විධායකයින් සඳහා නියමයන් සහ කොන්දේසි තවමත් අදාළ වේපසුව ., අධ්‍යක්ෂ මණ්ඩල | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා )BP) අංක 723/2019 අනුව 2019 සැප්තැම්බර් 30 සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) 51/2018 පත්‍රිකාව බලරහිත කර ඇති බැවින් 51/2018 පත්‍රිකාවේ සඳහන් පහසුකම් තවදුරටත් ක්‍රියාත්මක කළ නොහැක. එසේම, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවටට, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය )BOD) වෙත පැවරී ඇති අධිකාරිය ඉක්මවා යා |

යන අවස්ථාවේ දී ණයෙන් අයවිය යුතු යම් මුදලක් එවැනි සේවකයින්ගේ අවසාන ප්‍රතිලාභවලින්(terminal benefits) අයකර ගත යුතුය .කෙසේ වෙතත්, 2022දෙසැම්බර් 31 දින විශ්‍රාම ගත් පහත සඳහන් සේවකයින් ඉහත යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් වාහන ණය 2023 ජූනි දක්වා පියවා නොමැති බව නිරීක්ෂණය විය .විස්තර පහත දැක්වේ.

| සේවා අංකය | විශ්‍රාම යන දිනට අයකර ගතයුතු මුදල (රු.) | ගෙවා ඇති විශ්‍රාම ප්‍රතිලාභ (රු.) |
|---|---|---|
| 10290-5 | 2,641,700 | 25,220,890 |
| 10747-4 | 4,109,754 | 17,541,857 |
| 10735-9 | 2,637,298 | 16,168,890 |
| 10738-3 | 4,874,494 | 24,332,403 |
| 10811-8 | 2,641,700 | 17,064,729 |

ඉහත සඳහන් ණය පහසුකම් 2023 මාර්තු 27 දින අනුමත කරන ලද අංක 05/2023 දරණ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකාව හරහා කාර්ය මණ්ඩල ණය බවට පරිවර්තනය කර ඇති අතර එම ණය විශ්‍රාම ගිය දිනට පසුව පවතින සාමාන්‍ය ණය පොලී අනුපාතය වෙනුවට කාර්ය මණ්ඩල ණය පොලී අනුපාතයට ලබා දී ඇත . තවද, අර්පණ ලිපියේ දක්වා ඇති වසර පහක උපරිම ණය කාල සීමාවේ කොන්දේසියට පටහැනිව ණයවල කාලසීමාව තවත් කාලයක් සඳහා දීර්ඝ කර ඇත.

II. 2019සැප්තැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා )BP) අංක හි 2019/723 තීරණයමඟින්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 2018/51 යටතේ අනුමතප්‍රතිපත්තිය අත්හිටුවා ආයතනික කළමනාකරණ සාමාජිකයින්ගේ වාහන බැහැර කිරීමේ ප්‍රතිපත්තිය ලෙස අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක හි තීරණයේ 2019/723 යාත්මක ක්‍රි යා පටිපාටියසඳහන් ක්‍රි .කිරීමට තීරණය වියඅධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 160/2022 අනුව විශ්‍රාම යන අවස්ථාවේ දී වට්ටම් කිරීමේ පහසුකම නවතා දමන ලදී.

ආයතනික කළමනාකරණ සාමාජිකයින් සඳහා විශේෂ වාහන ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබූ වාහන ණය, කාර්ය මණ්ඩල චක්‍රලේඛ අංක 90/238සහ පසුකාලීන සංශෝධනය යටතේ හඳුන්වා දුන් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සාමාන්‍ය වාහන ණය යෝජනා ක්‍රමයට පරිවර්තනය කිරීමට/ ප්‍රතිව්‍යුහගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක යටතේ 2023/05 අනුමැතිය ලබාදෙන ලදී.

නීති උපදෙස් ලබාගෙන සහ එම නිලධාරීන්ගේ ගැටළු සැලකිල්ලට ගෙන ඉහත තීරණයට එළඹෙන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක යටතේ 2018/51 අනුමත කරන ලද විශේෂ ණය මයයෝජනා ක්‍ර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2019/723 දින 2019.09.30 අනුව කෙසේ වෙතත් .අත්හිටුවන ලදී විශේෂ ණය යෝජනා ක්‍රමය අවලංගු කර ඇතත්, එහි දක්වා ඇති නියමයන් සහ කොන්දේසි දැනටමත් ලබාගෙන ඇති ණය පහසුකම් සඳහා අදාළ වන බව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අනුව තීරණය කර 2020/02 මය එම යෝජනා ක්‍ර .ඇත යටතේ සහ බැංකුවේ දැනට යාත්මකක්‍රිඅධ්‍යක්ෂ මණ්ඩල නොහැකි අතර එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට එරෙහිව අධ්‍යක්ෂ මණ්ඩල අනුකාරක සභාව විසින් ලබා දෙන ඕනෑම අනුමැතියක් මණ්ඩලයේ අනුමැතියට යොමු කළ යුතුය.

තවද, බැංකුවේ සේවකයින්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී සහ තීරණ අනුමත කිරීමේදී, එම ප්‍රතිපත්ති සහ තීරණ හේතුවෙන් බැංකුවට අවම පාඩුවක් සිදු වන බව සහතික කිරීම අවශ්‍ය වේ. එසේම ප්‍රතිපත්ති සහ තීරණ අදාළ සියලුම සේවක කාණ්ඩවලට අදාලව ක්‍රියාත්මක කළ යුතු අතර දැඩි ලෙස අනුකූල වීම අවශ්‍ය වේ.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක 2018/51පත්‍රිකාව දින සිට අත්හිටුවා 30 සැප්තැම්බර් 2019 ඇති බැවින්, ලැබිය යුතු ණය ශේෂය වට්ටම් කිරීම සිදු කළ නොහැකි අතර එම ණය ශේෂය බැංකුව වෙත පියවිය යුතුයකෙසේ වෙතත් ., විගණනයට ඉදිරිපත් කරන ලද විස්තරවලට අනුව, ඉහත තීරණයට පටහැනිව විශ්‍රාම යන දිනයේ ණය සඳහා පහත සඳහන් වට්ටම් ලබා දී ඇත.

| සේවා අංකය | විශ්‍රාමික දිනය | විශ්‍රාම දිනට ශේෂය (ප්‍රාග්ධනය) (රු.) | ලියාහරින ලද මුදල (රු.( |
|---|---|---|---|
| 10783 | 2020.06.19 | 12,162,449 | 8,513,714 |
| 12289 | 2020.05.27 | 12,722,294 | 6,361,147 |
| 11000 | 2021.08.09 | 7,145,499 | 3,572,749 |
| 10776 | 2020.04.09 | 12,199,380 | 12,199,380 |
| 10697 | 2020.09.25 | 11,010,733 | 7,707,513 |

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක තිපත්තියට හි පවතින ප්‍ර 2018/51 අනුකූලව යෝජනා සලකා ධාන විධායක බැලීමට ප්‍ර ධිකාරී සාමාන්‍යා/නිලධාරී .වරයාට බලය පවරා ඇත

| සේවා අංකය | අනුමත කිරීම සාමාන්‍ය) ධාප්‍ර/අධිකාරී න විධායක (නිළධාරී |
|---|---|
| 10783 | 2020.08.17 |
| 12289 | 2020.08.17 |
| 11000 | 2021.08.09 |
| 10699 | 2020.12.03 |

සේවා අංක 10763 නිලධාරියා විශ්‍රාම යාමේදී දීර්ඝ සේවා කාලය සහ කැපවූ සේවාව පිළිබඳව සලකා බලා අංක CAY 6974 BMW530e දරන වාහනය ඔහු වෙත මුදා හැරීමට හා රු . 12,512,870.18 ඔහු ලබාගත් විශේෂ වාහන ණය යෝජනා ක්‍රමයේ අයවිය යුතු ශේෂය සමඟ පොලී වටිනාකම ලියාහැරීමට තීරණය කර ඇත.

III. කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිළධාරියෙකු - සේවා අංකය.19596 අංක BAF/D/PB/2019/E/01 දරණ විගණන විමසුමට බැංකුව විසින් යවන ලද පිළිතුරට අනුව, ආයතනික කළමනාකාරීත්වයට ගෙවනු ලබන අඩු වැටුප් සඳහා විසඳුමක් ලෙස ඉහත කී විශේෂ වාහන ණය යෝජනා ක්‍රමය බැංකුවේ ආයතනික සාමාජිකයින්ට හඳුන්වා දෙන ලදී. කෙසේ නමුත්, ඉහත ණය ප්‍රදානය කරන අවස්ථාව වනවිට, ස්ථිර ජොෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට ගෙවන ලද වැටුප මෙන් දෙගුණයක් ඉහත නිලධාරියා හට ගෙවා ඇත. ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකාවේ සඳහන් පරිදි වසර 2 ක ඉතිරි සේවා කාල නොමැතිව, 2020 ජූනි 30 දිනෙන්

ඔහු 2002.11.01 දින ස්ථිර කාලීන කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන බැංකු යෝජනා ක්‍රමයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු ශ්‍රේණියට සමාන ජොෂ්ඨ තැරැව්කරුවකු ලෙස බැංකුවට බැඳී ඇත . ධානබැංකුව ප්‍රතැරැව්කරු ලෙසත් නියෝජ්‍ය භාණ්ඩාගාර ප්‍රධානී ලෙසත් ඔහුගේ කොන්ත්‍රාත් පදනම දිගටම පවත්වාගෙන ගොස් ඇති අතර 2011.11.16 දින නව ස්ථිර කාලීන කොන්ත්‍රාත්තුවකට යටත්ව භාණ්ඩාගාර ප්‍රධානී ලෙස ඔහු පත් කර ඇති අතර එය 2022.1.31 දක්වා අඛණ්ඩව පැවති අතර පසුව නියෝජ්‍ය සමාන්‍යාධිකාරී භාණ්ඩාගාර ලෙස ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ඇත.

නියමිත කොන්ත්‍රාත් කාලය )2016 ජූලි 01 දින අත්සන් කරන ලද ( අවසන් වීමට තිබූ ඉහත සඳහන් නිලධාරියා (කොන්ත්‍රාත් පදනමවෙත ( සේවා කාලයඅවසන් වීමට වසර දෙකකට වඩා අවම කාලයක් තිබියදී රු.18,000,000ක විශේෂ වාහන ණයක් 2018 සැප්තැම්බර් 06 දින ප්‍රදානය කර ඇත.

විශේෂ වාහන ණයක් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) 51/2018 හි සුදුසුකම් නිර්ණායක අනුව, අයදුම්කරු අවම වශයෙන් වසර 01 ක සේවා කාලයක් සහිත ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයෙකු විය යුතුය . දානය ණය ප්‍ර විශේෂ වාහන කරන දිනය වන විට, සී . ෆොන්සේකා මහතා වසර 17කට වැඩි කාලයක් ස්ථිර කාලීන)fixed term) කොන්ත්‍රාත් සේවකයෙකු ලෙස බැංකුවේ අඛණ්ඩව සේවය කර ඇත.

IV. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි උපාය මාර්ගික සැලසුම් - සේවා අංක 10702

රු. 20,000,000 ක විශේෂ වාහන ණය මුදලක් ඉහත කී නිලධාරියා විසින් 2018 සැප්තැම්බර් 13 දින සියයට 5 ක පොලී අනුපාතයකට ලබාගෙන 2019 මාර්තු 28 දින වයස අවුරුදු 60 ට පෙර ම විශ්‍රා (ණය ලබා දී මාස හයකට පසු) රු එම ණය මුදලින් .ගොස් ඇත. 2,561,100 ක මුදලක් විශ්‍රාම යාමට පෙර ණය මුදල් වෙනුවෙන් නිලධාරියාගෙන් අයකරගෙන තිබුණි.

(i) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ) BHRRC) අංක 51/2018 පත්‍රිකාවට අනුව ඉතිරි ණය මුදල වට්ටම් කර තිබුණද, එම නිලධාරියා විසින් ණයලබා දුන් දින සිට වසර 2ක අවම කාල සීමාවක් සම්පූර්ණ කර නොතිබුණි.

(ii) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ BHRRC පත්‍රිකා අංක අනුව 2018/51, වාහන ණය ගිණුමේ අයවිය යුතු ශේෂය වට්ටම් සාධකවලට යටත්ව විශ්‍රාම යන අවස්ථාවේදී සේවකයා විසින් පියවිය යුතුයධිකාරී සාමාන්‍යානියෝජ්‍ය . හෝ ඉහළ අවම වශයෙන් ණියේශ්‍රේ ක සේවා කාලයක5 වසරේ සහිත

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 231/2019 අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව )BHRRC( විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි )DGM( සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී )SDGM( ශ්‍රේණියේ වසර 8 ක් ඇතුළුව වසර ගණනාවක් තිස්සේ බැංකුව වෙත කරන ලද දිගුකාලීන සේවාව අගය කිරීමක් ලෙස පහත යෝජනා අනුමත කරන ලදී.

1.බැංකුව විසින් ආයතනික කළමනාකාරිත්වයට පිරිනමන කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමයෙන් ඇය මිලදී ගත් වාහනය රු. මිලියනක නාමික අගයකට උකස ඇය වෙත පැවරීම.

2.ආයතනික කළමනාකාරිත්වය සඳහා වාහන ණය යෝජනා ක්‍රමයේ කොන්දේසි අභිබවා එම වාහන ණය ගිණුමේ ඉතිරි ශේෂය ප්‍රදානයක් මඟින් පියවීමට .

තවද, ලාභ අලාභ ගිණුමෙන් අයවිය යුතු මුදල් කපාහැරීමට කමිටුව තීරණය කරන ලදී.

බැංකුවේ වසර කට වැඩි සේවා 20 කාලයක් ඇති විධායක නිලධාරීන් ක වට්ටමක් අදාළ 70 සඳහා සියයට කෙසේ වෙතත් .වේ, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා )BP) අංක 2019/231 තීරණය පරිදි ඉහත වාහනය රු.මිලියනයක නාමික වටිනාකමකට පැවරීමට මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණිඒ අනුව ඉහත වාහනය . මාරු කිරීමේදී රු. 16,915,442 ක මුදලක් බැංකුව විසින් දරන ලදී . විස්තර පහත දක්වා ඇත.

| විස්තරය | රු. |
|---|---|
| ප්‍රදානිත වටිනාකම | 20,000,000 |
| විශ්‍රාමික දිනට අයවිය යුතු ශේෂය | 17,915,442 |
| BHRRC අංක 51/2018 අනුව වට්ටම් කළ අගය (70% *17,915,442) | 12,540,809 |
| නිලධාරියාගෙන් අයකළ යුතු මුදල | 5,374,633 |
| අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව අයකරගත් මුදල 231/2019 | 1,000,000 |
| බැංකුව විසින් දරන ලද අලාභයේ වටිනාකම | 4,374,633 |
| සම්පූර්ණ කපා හැරීමේ වටිනාකම | 16,915,442 |

V. හිටපු ප්‍රධාන විධායක නිලධාරී - සේවා අංක 10776

රු .17,355,429 ක විශේෂ වාහන ණය මුදලක් 2018 නොවැම්බර් 15 වන දින සියයට 5 ක පොලී අනුපාතයකට ඉහත කී නිලධාරියාට ලබා දී ඇත.

(i) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් විශ්‍රාම යන දිනය 2020 අගෝස්තු 31 වේ .අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ BHRRC පත්‍රිකා අංක 51/2018 අනුව ණය ලබා ගැනීමට ප්‍රමාණවත් අවම සේවා කාලය වර්ෂ දෙකක් විය යුතු වුවත් අවම වසර 2ක කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙර නිලධාරියා 2020 අප්‍රේල් 09 දින විශ්‍රාම ගොස් තිබුණි.

BHRRC 51/2018 අනුව, විශේෂ වාහන ණයක් ලබා ගැනීම සඳහා අවම සුදුසුකම් නිර්ණායක වන්නේ, බැංකුවේ වසර 05 කට වැඩි සේවා කාලයක් සහ ආයතනික කළමනාකරණ සාමාජිකයෙකු ලෙස අවම වශයෙන් වසර 01 ක සේවා කාලයක් සහිත වීම වන අතර 2013 වසර තුල ආයතනික කළමනාකරණ සාමාජිකයෙකු ලෙස පත්වී ඇත.

අදහස් සටහන් කර ගන්නා ලදී. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සටහන් කළ යුතුය;

- 2020 මාර්තු වන විට අයවිය යුතු ශේෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 278/2020 මඟින්

(ii) 2020 අප්‍රේල් 09 දිනැති අංක 278/2020 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා තීරණය පරිදි රු .12,512,870 ක අයවිය යුතු ශේෂය හා පොළිය ලියාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. 2020 මැයි 29 දිනැති ප්‍රධාන කළමණාකරු - කාර්ය - විසින් කළමණාකරුමූල්‍ය මණ්ඩල ණය ඒකකය වෙත යොමු කරන ලද ලියවිල්ල අනුව ණය පියවීම රු.12,199,379 ක් විය .

)2020.04.09 දින අනුමත කරන ලද) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී .

- අයවිය යුතු ශේෂය 2020.05.29 දින ලියා හැර ඇත .

කෙසේ වෙතත්, අප්‍රේල් මාසයේ වාරිකය ආපසු ගෙවීම හේතුවෙන් පියවීමේ දිනට අයවිය යුතු ශේෂය රු . 12,199,379.61ක් විය.

BHRRC පත්‍රිකා අංක 400/2020 අනුමැතිය යටත්වඔහුගේ , සේවය අගය කිරීමක් ලෙස ඔහුට මාස05ක මූලික වැටුපට සමාන මුදලක් ලබා දෙන ලදී.

(iii) 2020/400 දිනැති අංක 27 මැයි 2020 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා තීරණයට අනුව, ඔහු විශ්‍රාම යන තෙක් එනම් දක්වා 31 අගෝස්තු 2020 බැංකුවේ සේවය කළේ නම් වන්දි වෙනස ලබා දීමට සලකා බලන ලෙස ඉහත නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කර තිබුණිතවද ., ඉහත නිලධාරියා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක තනතුර සඳහා පත් කර තිබූ බවත් එම තනතුරෙන් ඉල්ලා අස්වී බැංකුවෙන් කලින් විශ්‍රාම ගැන්වීමක් ඉල්ලා සිටි බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සිහිපත් කර ඇතඡ් අනුව ., අප්‍රේ 2020ල් සිට 09 ම යන දිනය විශ්‍රා 31 අගෝස්තු 2020 දක්වා රු.) 2,911,808 මූලික වැටුප X මාස (5සම්පූර්ණ සහ අවසාන වන්දි ගෙවීමක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ (BHRRC) පත්‍රිකා අංක 51/2018 මඟින් ලබා දී ඇති උපදෙස් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) 121/2020 මඟින් අවලංගු වී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) 51/2018 යටතේ ලබාගත් වාහන ණය මුදා හැරීමේ වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ශ්‍රේණියේ වැඩබලන කාලසීමාව ආයතනික කළමනාකරණයට අදාළ අත්දැකීම් ලෙස සලකා බැලීමට අනුමැතිය ලබා දී ඇත .

VI. හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සේවා අංක -(අයකිරීම්)10699 ඉහත කී නිලධාරියාට 2018 සැප්තැම්බර් 11 වැනි දින රු . 17,970,000 ක විශේෂ වාහන ණය පහසුකමක් ලබා දී ඇති අතර ඔහු වයස අවුරුදු 60 සම්පූර්ණව 2020 සැප්තැම්බර් 25 වැනි දිනට සේවයෙන් විශ්‍රාම ගොස් ඇතම විශ්‍රා .

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 51/2018 යටතේ ලබාදුන් විශේෂ වාහන ණය, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 723/2019 මඟින් අවලංගු කළද ඒ මඟින් නව වාහන ඉවත් කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබූ බැවින් BHRRC පත්‍රිකා අංක

යන දිනට විශේෂ වාහන ණය පහසුකමෙහිඅයවිය යුතු ශේෂය රු . 11,010,733 කි.
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) අංක කාවේ තීරණයට දරණ පත්‍රි 2020/121 අනුව, විශ්‍රාමික දිනට පසුව එනම් දින අනුමත 25 නොවැම්බර් 2020 කරන ලදපරිදි වැඩබලන සේවා කාලය සලකා බැලීමෙන් මෙම පහසුකමට සියයට ක වට්ටමක් 70 කෙසේ වෙතත් .ලබා දෙන ලදී, එම තීරණය අනුමත කිරීමට පෙර විශ්‍රාම ගිය ඉහත කී නිලධාරියාගේ වැඩ බලන සේවා කාලය සලකා බැලීමට තීරණය වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 2018/51 අනුව, ඉතිරි ණය ශේෂයේ වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී ආයතනික මට්ටමේ තනතුරයන් හි වැඩ බලන සේවා කාලය සලකා බලනු නොලැබේ.

51/2018 යටතේ පහසුකම් ලබා සිටින නිලධාරීන් වෙනුවෙන් එය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවසර ලැබුණි.

VII. පහත සඳහන් නිලධාරීන් සේවයේ යෙදී සිටින අතර වාහන ණයවල අයවිය යුතු ශේෂය පහත පරිදි වේ.

| සේවා අංකය | දිනට 2023.04.30 ග්ධන ශේෂයප්‍රා (රු.) |
|---|---|
| 10692-2 | 2,641,700 |
| 10975-1 | 5,174,429 |
| 12297-8 | 4,816,969 |
| 12443-8 | 2,935,221 |

BHRRC පත්‍රිකා අංක 51/2018 යටතේ, මාසික වාරිකය තුල ණය වාරිකය, රක්ෂණ සහ නඩත්තු වලින් සමන්විත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සඳහා රු. 390,000ක් සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සඳහා රු. 425,000 ක මාසික වාහන දීමනාවක් වසර 5 දක්වා අනුමත කරන ලදී .2019 සැප්තැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 723/2019 හි ගත් තීරණයට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 51/2018 යටතේ අනුමත කරන ලද ප්‍රතිපත්තිය අත්හිටුවා තිබුණි. නමුත් විගණනයට ඉදිරිපත් කළ

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 487/2019 මඟින් අනුමැතිය ලබා ගන්නා ලදී.

ප්‍රධාන විධායක නිලධාරී සාමා/න්‍යාධිකාරී එ)වකට ( වාහනය සන්තකයේ තබා .ගැනීමට අනුමත කර ඇත

විස්තර අනුව ඉහත තීරණයට පටහැනිව අදාළ සේවකයන්ට වාහන දීමනා ගෙවා තිබුණි.

VIII. හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- සේවා ) න්තර බැංකුකරණයජාත්‍ය අංක10959)

ඉහත නිලධාරිනිය 2019 මාර්තු 06 වන දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස වසර 29 ක සේවා කාලයක් සහිතව ආයතනික සාමාජිකයෙකු ලෙස ) ආසන්න වශයෙන් වසර03 ක සේවා කාලයක් සමඟ .ම ගන්නා ලදීවිශ්‍රා ( 2018 කාලසීමාව තුළ ආයතනික සාමාජිකයින් සඳහා නව විශේෂ වාහන ණයක් හඳුන්වා දෙන අවස්ථාවේදී, ඉහත නිලධාරිනියට විශ්‍රාම යාමට අවම වශයෙන් තවත් වසර දෙකක කාලයක් නොතිබූ බැවින් එම ණය යෝජනා ක්‍රමය සඳහා ඇයට හිමිකමක් නොතිබුණිතවද ., අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකා අංක 89/2016 පත්‍රිකාව හරහා අනුමත කරන ලද බැංකුවේ සංශෝධිත ප්‍රවාහන ප්‍රතිපත්තියේ 15 - A වගන්තියට අනුව, වසර 7කට වැඩි ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආයතනික කළමනාකාරීත්ව සාමාජිකයෙකුට කිසිදු පිරිවැයකින් තොරව පාවිච්චි කළ වාහනය ලබා දෙනු ලැබේකෙසේ . වෙතත්, ආයතනික සාමාජිකයෙකු ලෙස අවම සේවා අවශ්‍යතාවය සපුරා නොමැති බැවින් ඉහත නිලධාරිනියට එලෙස හිමිකමක් නොතිබුණි.

(i) ඉහත නිලධාරිනිය ආයතනික සාමාජිකයෙකු ලෙස වසර 3 ක සේවා කාලයක් පමණක් සම්පූර්ණ කර තිබුණද, අංක 487/2019 හා 314/2020 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් ලබා දී ඇති තීරණවලට අනුව අංක WPCAG - 3450 දරන වාහනයේ හිමිකාරිත්වය වෙළඳපල වටිනාකමින් සියයට 50 (භෞතික නොවනඇය වෙත ( .පවරා ඇත

(ii) ඉහත සඳහන් වාහනය 2019 මාර්තු 06 විශ්‍රාම ගිය දින සිට වසරක් සහ මාස 3 ක කාලයක්

| | | |
|---|---|---|
| ඉහත නිලධාරිනිය සතුව තිබූ අතර වාහනය නිල වශයෙන් 2020 ජුනි 19 දින නිදහස්කර ඇත. | | |

## 3.4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 3.4.1. බැංකුවේ කාර්ය මණ්ඩල පිරිවැය අනෙකුත් බැංකු හා සැසඳීම විශ්ලේෂණය කිරීමේදී,<br>(i) බැංකුව එක් සේවකයෙකු සඳහා වසරකට රු මිලියන. 3.61 ක පිරිවැයක් දැරූ නමුත්, 2022 වර්ෂය සඳහා එක් සේවකයෙකුගෙන් උපයා ඇති ලාභය රු. මිලියන 2.33 ක් පමණක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනෙකුත් බැංකු එක් සේවකයෙකුගෙන් වසරකට රු. මිලියන 2.72 සිට රු. මිලියන 4.49 දක්වා ලාභයක් වාර්තා කර තිබුණි.<br>(ii) 2022 වසර සඳහා බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස කාර්ය මණ්ඩල පිරිවැය සියයට 34.61 ක් වූ අතර එය එම කර්මාන්තයේම අනෙකුත් බැංකු හා සසඳන විට ඉහළම අගය නියෝජනය කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් බැංකු වල අනුපාතය සියයට 25.90 සිට සියයට 32.36 දක්වා පරාසයක පැවතුනි. | පසුගිය වසර පහ තුළ බැංකුව සිය ලාභයේ සැලකිය යුතු ඉහළ යෑමක් සාක්ෂි දරා ඇති අතර, එයට සමගාමීව එහි ශ්‍රම බලකායේ සැලකිය යුතු පහත වැටීමක් අත්විඳිමින් ඇත. මෙම ප්‍රවණතාවලට ප්‍රතිචාර වශයෙන්, පිරිවැය අඩු කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් බැංකුව ක්‍රියාකාරීව කටයුතු ආරම්භ කර ඇත. මෙම උත්සාහයන් විශේෂයෙන් මූල්‍ය, ක්‍රියාවලි කළමනාකරණය සහ ඩිජිටල්කරණය ඇතුළු විවිධ දෙපාර්තමේන්තු කෙරෙහි අවධානය යොමු කර ඇත. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුව අනාගතයේදී කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය හරහා කාර්ය සාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ ක්‍රමයකට ක්‍රියාශීලී පියවර ගෙන ඇත. | සේවක කාර්යක්ෂමතාව ඉහළ නංවන අතරම බැංකු අරමුදල් ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. තවද, උසස්වීම් සහ බඳවාගැනීම් විනිවිද භාවයෙන් යුක්ත විය යුතු අතර, එබැවින්, එක් එක් තනතුරේ උසස්වීම් සහ බඳවා ගැනීම් සඳහා බැංකුවට අනුමත ක්‍රියා පටිපාටියක් තිබිය යුතු අතර, වරින් වර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුමත කිරීමකින් තොරව සෑම උසස්වීමකදීම එම අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය. |
| 3.4.2. බඳවා ගැනීම් සහ උසස්වීම් | | |
| I. සාමාන්‍යාධිකාරී (වැඩ බලන) පත් කිරීම සහ පත් කරන ලද වැඩ බලන සාමාන්‍යාධිකාරීගේ බැංකු අංශයේ පළපුරුද්ද | | |
| ඉහත නිලධාරියා 2002 නොවැම්බර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත තැරැව්කරු තනතුර සඳහා බැංකුවට සම්බන්ධ වී ඇති අතර 2003 නොවැම්බර් 27 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන තැරැව්කරු ලෙස උසස් කර ඇත. 2007 ජුලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර සහ ආයෝජන බැංකු නියෝජ්‍ය ප්‍රධානී ලෙස සහ 2020 නොවැම්බර් 02 දින සිට | අවදානම් කළමනාකරණය සහ 2022-2024 උපායමාර්ගික සැලැස්ම සමඟ පෙළගැස්වීම පිළිබඳ සලකා බැලීම නිසා, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී සඳහා නව ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) හඳුන්වා දීමට මණ්ඩලය තීරණය කර ඇත. මෙම නව ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සඳහා ද්‍රවශීලතා අනුපාත, නුබුන්වත් බව | |

භාණ්ඩාගාර ප්‍රධානී ලෙස කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු අංක 01/2022 සහ BP අංක 105/2022 දරන තීරණය හරහා 2022 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නිලධාරියා ස්ථිර සේවය වෙත අන්තර්ග්‍රහණය කර ඇත. 2022 දෙසැම්බර් 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි 2023 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සාමාන්‍යාධිකාරී (වැඩබලන) ලෙස පත්කර ඇත. ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් බැංකුවේ මෙහෙයුම්, මූල්‍ය වෙළෙඳපොළ සහ ආර්ථිකයේ අපේක්ෂාවන්ට අනුකූල බව සහතික කිරීම සඳහා සැලකිය යුතු වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතුය. එබැවින්, සමස්ත බැංකු මෙහෙයුම් පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී තනතුර දරන පුද්ගලයාට බෙහෙවින් අදාළ වේ. ඉහත නිලධාරියාට භාණ්ඩාගාර විෂය සම්බන්ධයෙන් වසර විස්සක (20) පළපුරුද්දක් ඇතත් බැංකු කටයුතු සම්බන්ධ අනෙකුත් ක්ෂේත්‍ර සම්බන්ධ පළපුරුද්ද නිරීක්ෂණය වී නොමැත.

II. කළමනාකරු වෙත උසස්වීම් 3-I ශ්‍රේණිය 2018(2021)

2020 අගෝස්තු 20 දිනැති අංක 8550/2020 දරන කාර්යමණ්ඩල චක්‍රලේඛ ලිපියට අනුව, 2019 දෙසැම්බර් 31 දිනට සේවක පුරප්පාඩු 287ක් පිරවීම සඳහා සුදුසුකම් ලත් සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව කළමනාකරු 3-I ශ්‍රේණිය සඳහා උසස්වීම් ලබා දීම සඳහා සලකා බලන උසස්වීම් ක්‍රම හා අනෙකුත් කොන්දේසි කාර්යමණ්ඩල චක්‍රලේඛ අංක 300/99 හා 300/99(1) අනුව සලකා බලන ලදී.

(i) ඉහත පුරප්පාඩු පුරවා ඇත්තේ සියයට 30ක ජ්‍යෝෂ්ඨතා පදනම සහ සියයට 70ක ලිඛිත විභාග

ආරක්ෂණය, ද්‍රවශීලතා හිඟයන් සඳහා කටයුතු කිරීම සහ නව ආයතනික ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම ඇතුළත් වේ. වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් නොතකා මෙම කාර්යසාධන දර්ශකයන් (KPIs) සාක්ෂාත් කර ගැනීමෙන් සැලකිය යුතු ප්‍රගතියක් වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කළ කාලය තුළ ලබා ඇත. එම කාලසීමාව තුළ ද්‍රවශීලතා හිඟය සහ අහිතකර ඇමෙරිකානු ඩොලර් (USD) සහ ශ්‍රී ලංකා රුපියල් (LKR) ද්‍රවශීලතා තත්ත්වය ඵලදායී ලෙස අඩු කිරීමට බැංකුවට හැකි විය. ඊට අමතරව බැංකුව විසින් දේශීය හා විදේශීය බැංකු වල ඇති සියලුම ඇමෙරිකානු ඩොලර් (USD) වගකීම් සම්පූර්ණයෙන්ම පියවා ඇත. තවද, ව්‍යාකූල ආර්ථිකයක් පැවැතියද 2023 පළමු කාර්තුවේදී රු. බිලියන 2.2 ක ලාභයක් අත්කරගෙන ඇත. ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරයා පත්කිරීම සඳහා පවතින විකල්පයන් නිරීක්ෂණය කළ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වූයේ ඔහුගේ හැකියාවන්ගෙන් ප්‍රමාණවත් කුසලතා සහ විශ්වාසයක් පෙන්නුම් කර ඇති හෙයින් ෆොන්සේකා මහතා මේ මොහොතේ බැංකුව මෙහෙයවීමට බැංකු කාර්ය මණ්ඩලය අතර සිටින හොඳම අපේක්ෂකයා බව ය.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, 2023 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුවේ මහ බැංකුවේ යෝග්‍යතාවය සහ අනුමැතිය ලබා ගැනීමට යටත්ව ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරයා ලෙස කේ.සී.ජේ.සී ෆොන්සේකා මහතා පත් කිරීම ස්ථිර කිරීමට මණ්ඩලය ඒකමතිකව තීරණය කර ඇත. ඒ අනුව, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා ලෙස කේ.සී.ජේ.සී ෆොන්සේකා මහතා පත් කිරීමට ඔවුන්ගේ කැමැත්ත ලබාදෙන ලෙස ඉල්ලා අධ්‍යක්ෂ බැංකු

පදනම (A (50%) සහ B (20%) මත වේ. ඉහත තනතුරට උසස්වීම සඳහා සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සේවා කාලය, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, සම්මුඛ පරීක්ෂණ ලකුණු සහ ලිඛිත විභාගයේ විභාග ලකුණු සලකා බලා ඇත. කෙසේ වෙතත්, ලිඛිත විභාග ලකුණු සහ සම්මුඛ පරීක්ෂණ ලකුණු බැංකුවෙන් ඉල්ලා තිබුණද, එවැනි තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. එබැවින් තෝරා ගැනීමේ පටිපාටියේ විනිවිදභාවය පිළිබඳව විගණනයට ප්‍රශ්නකාරී වේ.

(ii) මාණ්ඩලික චක්‍රලේඛ අංක 8550/2020 හි 4.8 වගන්තියට අනුව, අයදුම්කරුවන්ට පෙර වසර 10ක සිට ලිඛිත තරඟ විභාගවලින් ලබාගත් ලකුණු ඉදිරියට ගෙන යාමට අවසර ඇත. ඒ අනුව, සමහර අයදුම්කරුවන්ට විභාග කිහිපයකට පෙනී සිටිය හැකි අතර අනෙක් අයදුම්කරුවන්ට එසේ නොවිය හැකි බැවින්, ඉහත තනතුර සඳහා තෝරා ගැනීම සඳහා අයදුම්කරුවන්ට සමාන අවස්ථාවක් නොමැත.

අධීක්ෂක- ශ්‍රී ලංකා මහබැංකුව වෙත ලිපියක් යවා ඇත.

ලිඛිත විභාග ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර අයදුම්කරුවන්ට පමණක් ප්‍රතිඵල තනි තනිව ලබාගැනීමට අවසර ලැබේ. විගණන කණ්ඩායම ලිඛිත විභාග ලකුණු ඉල්ලා ඇති බැවින්, අපි දැනටමත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇත. සම්මුඛ පරීක්ෂණ ලකුණු ඉතා රහස්‍ය වන අතර මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත භාරයේ තබා ඇති අතර විගණන පරීක්ෂාව සඳහා ලබා ගත හැකිය.

කළමනාකරු 3-I සඳහා වන උසස්වීම් සඳහා අංක 444/2018 චක්‍රලේඛය අදාළ වුවද, අංක 300/99 චක්‍රලේඛය මත පදනම්ව එක් වරක් පමණක් බලපාන පරිදි සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ අතර එහිදී පෙර වසර 10 ක විභාග ලකුණු සලකා බැලීමට තීරණය විය. කෙසේ නමුත් වර්තමානයේ අංක 444/2018 චක්‍රලේඛයට අනුකූලව සහ 444/2018 (2) 7. (iv) සහ (v) අනුව උසස්වීම් සඳහා එක් එක් විභාගයෙන් උපයා ගත් ලකුණු සහකාර කළමනාකරු, කළමනාකරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු යන ශ්‍රේණිවලට උසස් කිරීම සඳහා, ඉදිරියට ගෙන යා හැක්කේ අඛණ්ඩ උසස්වීම් වට දෙකක් සඳහා පමණක් වන අතර, පෙර විභාග ලකුණු ඉදිරියට ගෙන යාමට අදහස් කරන අයදුම්කරුවන් වත්මන් උසස්වීම් වටයේ ලිඛිත තරඟ විභාගයෙන් සමත් වීම අත්‍යවශ්‍ය වේ.

III. සහකාර කළමනාකරු 3-III ශ්‍රේණියට උසස්වීම්

2019 ජූනි 10 දිනැති, කාර්යමණ්ඩල චක්‍රලේඛ අංක 8372/2019 ලිපියට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට සුදුසුකම් නිර්ණායක සපුරාලන මාණ්ඩලික

කාර්යමණ්ඩල චක්‍රලේඛ අංක 300/99 යටතේ සහකාර කළමනාකරු (3-III) ශ්‍රේණියට උසස් කිරීම කැඳවන ලදී. ඒ අනුව විභාගය සමත් සියලුම සේවකයන්ට උසස්වීම් ලබා දී ඇත. මෙහි උසස්වීම් සඳහා සේවක සංඛ්‍යාව

සහායකයන්ගෙන් සහකාර කළමනාකරු (3-III) ශ්‍රේණියට උසස් කිරීම සඳහා ලිඛිත විභාගයේ අවම ලකුණු සියයට 50 සීමාවට යටත්ව, සේවක අවශ්‍යතා නොසලකා අයදුම්පත් කැඳවා තිබුණි. ඒ අනුව, 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව පුරප්පාඩු 621ක් වුවද, 2019 දෙසැම්බර් 15 වන දින සේවක සංඛ්‍යාව 786ක් උසස් කර ඇත.

පදනම් නොවන අතර එය අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) තීරණය 2/2019 යටතේ 2019/06/06 දිනැති චක්‍රලේඛයේ සඳහන් කර ඇත. කෙසේ නමුත්, මෙම පරිචය පවත්වාගෙන යාම තුල සේවක සංඛ්‍යාවේ ඉහළ අතිරික්තයක් ඇති කරයි. මෙම ගැටලුවට පිළිතුරක් ලෙස බැංකුව විසින් කාර්ය මණ්ඩල චක්‍රලේඛය 444/2018 පිළිපදින අතර 2024.03.31 වන විට අපගේ බඳවා ගැනීමේ පටිපාටිය(SOR) වෙත මෙය ඇතුළත් කරන්නෙමු.

3.4.3 බඳවා ගැනීමේ පටිපාටිය (SOR)

2022 අගෝස්තු 08 වැනි දින අංක 74/2022 දරන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) පත්‍රිකාව හරහා බැංකුවෙහි බඳවා ගැනීමේ පටිපාටිය (SOR) අනුමත කර ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අවධානය යොමු කර ඇති අතර ඉදිරියේදී මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත.

I. 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 7 වැනි වගන්තියට අනුව, බැංකුවේ කටයුතු පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය, පාලනය සහ පරිපාලනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. කෙසේ වෙතත්, ඉහත බඳවා ගැනීමේ පටිපාටිය(SOR) සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය බැංකුව විසින් ලබාගෙන නොතිබුණි.

අවධානය යොමු කර ඇති අතර අනාගත අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) හරහා මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත.

II. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) අනුමත බඳවා ගැනීමේ පටිපාටියෙහි හි 4.8 වගන්තියට අනුව, පත්කිරීමේ අධිකාරිය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) වේ. නමුත්, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 7 වැනි වගන්තියට අනුව, බැංකුවේ කටයුතු සාමාන්‍ය අධීක්ෂණය, පාලනය සහ පරිපාලනය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර එබැවින් ඉහත බඳවා ගැනීමේ පටිපාටියෙහි හි 4.8 වගන්තිය මහජන බැංකු පනත සමඟ පරස්පර වේ.

3.4.4 ආයතනික කළමනාකරණ කණ්ඩායමේ වැටුප් සැකසීම.

I. BP 48/2001 දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව වර්ෂ 2001 සිට ජ්‍යෙෂ්ඨ විධායක වැටුප් සැකසීම සඳහා මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම සමඟ ගිවිසුම්ගත වී ඇත. තවද, බැංකුවේ සමස්ත ආයතනික සහ විධායක කළමනාකාරීත්වයේ වැටුප් සැකසීම දක්වා මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම සමඟ සේවා විෂය පථය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2018 ජනවාරි 01 දින සිට වසර 02ක කාලයක් සඳහා 2019 නොවැම්බර් 06 වැනි දින ගිවිසුමක් අත්සන් කර තිබූ අතර දෙපාර්ශ්වයේම එකඟතාව මත තවත් වසර දෙකකින් එය දීර්ඝ කළ හැකි බව සඳහන් කර ඇත. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 (2020 ජනවාරි 01 සිට) දක්වා කාලය සඳහා ගිවිසුම අලුත් කිරීම සහ විගණිත දිනය දක්වා කාලය සඳහා නව ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් 2020 ජනවාරි 01 දින සිට 2023 මැයි 31 විගණිත දිනය දක්වා කාලය සඳහා කිසිදු ගිවිසුමකින් තොරව ගෙවීම් කර ඇති බවට විගණනයට නිරීක්ෂණය වීය.

II. ඉහත ගිවිසුමට අනුව, බැංකුව විසින් මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති තොරතුරු සහ උපදෙස් මත වැටුප් සකස් කරනු ලබන අතර, උපයන විට ගෙවීම් බදු, සේවක අර්ථසාධක අරමුදල් (EPF) සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය (ETF) වැනි සේවකයින්ට ලබා දෙන මුදල් සහ මුදල් නොවන ප්‍රතිලාභ මේ අතර ඇතුළත් විය යුතුය. බැංකුව විසින් කලින් කලට නිකුත් කරන ලද උපදෙස් හා සංශෝධන අනුව බැංකුවේ අනෙකුත් සියලුම සේවකයින්ගේ වැටුප මානව සම්පත් මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම පත් කිරීමේ තීරණය 2000 වසර දක්වා දිව යන අතර මූලික තීරණය ගැනීමේ හේතුව වූයේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා විය. විධිමත් ගිවිසුමක් නොමැති වීම 2019 දී නිවැරදි කර ඇති අතර, එම ගිවිසුම අන්‍යෝන්‍ය අවබෝධයෙන් දීර්ඝ කර ඇත. එවැනි අවබෝධයෙන් විධිමත් කිරීම 2023 දෙසැම්බර් 31 දිනට පෙර සිදු කෙරේ.මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම වෙත දැනට මාසික ගාස්තුවක් ලෙස රු. 40,250/- එකී ගිවිසුමේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ සේවාවන් සඳහා ගෙවීම් සිදු කරයි.

අංශය විසින් සකස් කරනු ලැබේ. ඒ අනුව ඉහත පරිදි මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම වෙත ආයතනික සහ විධායක කළමනාකාරීත්වයේ වැටුප් සැකසීම පැවරීමේ අරමුණ සහ හේතුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර නොමැත.

III. තවද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ආයතනික හා විධායක කළමනාකාරීත්වයේ සැබෑ සංඛ්‍යාව නිලධාරීන් 50ක් පමණ වූ අතර ආයතනික සහ විධායක කළමනාකාරීත්වයේ වැටුප් සැකසීම සඳහා 2018 වසරේ සිට 2023 මැයි 31 දක්වා මැනේජ්මන්ට් සිස්ටම්ස් (පුද්ගලික) සමාගම වෙත රු. 3,403,955 ක් ගෙවා ඇත.

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 3.5.1. ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම නොමැති වීම<br>බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 01 වැනි ඡේදයේ 8.2 වගන්තියට අනුව ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව බැංකුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද, බැංකුව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ සමස්ත ක්‍රියාකාරී සැලැස්ම විගණන පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් සටහන් කර ගන්නා ලදී.<br>ලබන වසරේ සිට සමස්ත බැංකුවම ආවරණය වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමින් පවතී. නියම කර ඇති මාර්ගෝපදේශ පිළිපැදීමේ අවශ්‍යතාවය සහ සමස්ත බැංකුවම ආවරණය වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ වැදගත්කම පිළිබඳව අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | ස්ථාපිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඵලදායි හා කාර්යක්ෂම ආකාරයෙන් හැසිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. තවද, බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අඩංගු නොවන කරුණු සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීම අවශ්‍ය වේ. |
| 3.5.2. ප්‍රසම්පාදන ක්‍රමය<br>I. තෑගි භාණ්ඩ සඳහා පැන්සල් සහ උපකරණ පෙට්ටි ප්‍රසම්පාදනය රු. 10,785,000<br>(i) සමාගමේ ඉල්ලීම සහ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ඉදිරිපත් කළ ලිපිය මත පදනම්ව මහජන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව සුදුසු තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය නොකර පැන්සල් පෙට්ටි 37,000ක් සහ කවකටු පෙට්ටි 70,000ක් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි. | අදහස් සටහන් කර ගන්නා ලදී. පැන්සල් පෙට්ටි සහ කවකටු පෙට්ටිවලට අදාල සඳහන් කරන ලද ප්‍රසම්පාදනය විශේෂ තත්වයන් යටතේ සිදු කරන ලද එක් මිලදී ගැනීමකි. | |

(ii) ඒ අනුව, ප්‍රසම්පාදන කාර්යයට අදාළ පිරිවිතරයන් තීරණය කිරීම බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 02 පරිච්ඡේදයේ 6.1 (d) (ii) සහ 3.1 (f) වගන්තියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් වෙන වෙනම සමාලෝචනය කර අනුමත කළ යුතු වුවද තෑගි භාණ්ඩ සඳහා පැන්සල් පෙට්ටි සහ කවකටු පෙට්ටි ප්‍රසම්පාදනය කිරීමේදී තාක්ෂණික පිරිවිතර සකස් කර නොතිබුණි. තවද, මහජන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2 වන පරිච්ඡේදයේ 4 වන ඡේදයට අනුව රු. මිලියන 5 ට වැඩි ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන කමිටුවක් විසින් සකස් කළ යුතුය. තවද, මහජන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2 වන පරිච්ඡේදයේ 6.2 ඡේදය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත ප්‍රසම්පාදනය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික කමිටුවක් පත් කර නොතිබුණි.

(iii) මහජන බැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 5.4 වගන්තියට පටහැනිව ව්‍යාපෘති අවසර ඉල්ලීම (Project Authorization Request) සකස් කර අනුමත කර නොතිබුණි. තවද, ලංසු ලේඛන ද සකස් කර නොතිබුණි.

(iv) ඉහත සමාගම විසින් 2020 සැප්තැම්බර් 29 දිනැතිව අග්‍රාමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සහ 2023 ජූනි 22 දින විගණනය මඟින් සිදු කරන ලද භෞතික පරීක්ෂණය සහ විමසීම් අනුව මහජන බැංකුවේ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත නිලධාරියකුගේ වාචික ඉල්ලීම මත මෙම ඇණවුම ලබා දී ඇත. ප්‍රධාන කාර්යාලය මඟින් මිලදී ගැනීම් සිදුකරන බව දක්වමින් එම ඇණවුම අත්හිටුවා තිබූ නමුත් විශේෂ තැන්පතු ප්‍රවර්ධන ව්‍යාපාරයක් ලෙස දක්වමින් 2021 වර්ෂයේදී ඉහත ප්‍රසම්පාදනය සිදු කරඇත.

බැංකුව සඳහා භාණ්ඩ සහ අනෙකුත් සේවාවන් මිලදී

| | |
|---|---|
| (v) 2023 ජූනි 22 වැනි දින විගණනය මඟින් සිදු කරන ලද භෞතික පරීක්ෂණයට හා විමසීම්වලට අනුව මහජන බැංකුවේ නම සහිත පැන්සල් පෙට්ටි සහ කවකටු පෙට්ටි 6,000ක් විකිණීම සඳහා තබා තිබුණි. ඉහත පෞද්ගලික ආයතනයේ කවකටු පෙට්ටියක් රු. 290 කට මහජනතාවට අලෙවි කර ඇත. බාහිර පාර්ශ්වයන්ට බැංකුවේ නම සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධියේ විකිණීම බැංකු කළමනාකාරිත්වය වැළැක්විය යුතු බව අවධාරණය කෙරේ. එමෙන්ම විෂමාචාරය සිදුකළ සේවකයන්ට එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. | ගැනීම සම්බන්ධයෙන් බැංකුවේ මෙහෙයුම් අත්පොත තුළ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. කිසිදු අභ්‍යන්තර හෝ බාහිර විගණනයකින්/පරීක්ෂණයකින් 2016-2020 උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා අනුගමනය කර තිබූ ප්‍රසම්පාදන ක්‍රමය පිළිබඳව කිසිදු ඍණාත්මක ප්‍රතිචාරයක් දක්වා නොතිබූ බැවින් බැංකුව විසින් එම ක්‍රමයම අනුගමනය කරන ලදී. තවද, 2021-2023 උපායමාර්ගික සැලැස්ම සඳහා බැංකුව වඩා හොඳ සහ විනිවිද පෙනෙන ක්‍රමයක් අනුගමනය කර ඇති අතර, හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මණ්ඩලයේ උපදෙස් පරිදි අභිලාෂ කැඳවීම සඳහා වූ ඉල්ලීමක් නිකුත් කරන ලදී. |
| II. 2021-2023 සහ 2022 - 2024 කාලය සඳහා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. | |
| (i) මෙම ප්‍රසම්පාදනයේ පිරිවැය රු. මිලියන 20 ඉක්මවන බැවින් වෙළඳපොල මිල සැඳහුම් (national shopping) වෙනුවට බැංකුව විසින් ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය හෝ ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය කළ යුතුය. කුඩා වටිනාකමක් සහිත ප්‍රසම්පාදන සහ උපදේශන නොවන සේවාවන් සඳහා වෙළඳපොල මිල සැඳහුම් (national shopping) සුදුසු වේ. | ලංසු තැබීමේ ක්‍රියාවලියක් සම්බන්ධ නොවූ බැවින්, උපායමාර්ගික සැලැස්ම 2022-2024 පිළියෙල කිරීම සඳහා ලංසු ඇපයක්ද ලබාගෙන නොමැත. තවද, 2016-2020 උපායමාර්ගික සැලැස්මට අදාළ පිරිවැය ඇමෙරිකානු ඩොලර් 75,200 (ආසන්න වශයෙන් රු. මිලියන 7.17) වුවද ලංසු ඇපයක්ද ලබාගෙන නොමැත. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදයේ 05 වැනි වගන්තියට අනුව, රු. මිලියන 5 ඉක්මවන ව්‍යාපෘතියක් සඳහා ලංසු ඉදිරිපත් කරන සියලුම ලංසුකරුවන්ගෙන් ලංසු ඇපයක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, වටිනාකම රු. මිලියන 31 ක් වූ මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් බැංකුව ලංසු ඇපයක් ලබාගෙන නොතිබුණි. | අභිලාෂ කැඳවීම් ඉල්ලීම (RFP) නිකුත් කිරීම ආරම්භ කරන ලද්දේ සම්පූර්ණ අගුලු දැමීමේ කාල සීමාවක් තුළ වන අතර වසංගත තත්වයක් තුළ ප්‍රමාදයන් නොවැළැක්විය හැකිය. තවද, රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් එවැනි වගන්ති සාධාරණීකරණය කළ නොහැක. එපමණක් නොව, සාමාන්‍යයෙන් අභිලාෂ කැඳවීම් ඉල්ලීම (RFP) වලට එවැනි |
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදයේ 7 (j) වගන්තියට අනුව, සිදු කරන ලද කාර්යයේ ප්‍රමාදයන් අවම කිරීමට උපකාර වන ප්‍රමාද වූ කාර්ය සම්බන්ධයෙන් දඩ අයකිරීම පිළිබඳව වන වගන්ති බැංකුව | |

විසින් අභිලාෂ කැඳවීම සඳහා වූ ඉල්ලීමෙහි (Request for proposal) ඇතුළත් කර නොතිබුණි. එවැනි වගන්තියක් නොතිබීම නිසා, මෙම ප්‍රසම්පාදනයේ මාස 3 සිට 4 දක්වා ප්‍රමාදයන් කළමනාකරණය කිරීමට බැංකුවට නොහැකි විය.

වගන්තියක් ඇතුළත් නොවන අතර එම ආරාධනා බොහෝ දෙනෙකුට නිකුත් කළත් එවැනි වගන්ති අදාළ වන්නේ තෝරාගත් පාර්ශවයට පමණි. එසේම, අභිලාෂ කැඳවීම් ඉල්ලීම (RFP) යනු බලාත්මක කළ හැකි නීතිමය ලියවිල්ලක් ද නොවේ.